
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

ශ්‍රී බුද්ධ වර්ෂ 2559 බිනර මස 27 වන රිවි දින


2015 සැප්තැම්බර් මස 27 වැනි ඉරුදින



නොමිලේ පිරිනමන දහම් පඬුරකි

විකිණීම සඳහා නොවේ

# බිනර පොහොය දිනයේ වැදගත්කම



වස්සාන සමයෙහි එළඹෙන බිනර පොහොය භික්ෂූන් වහන්සේලා සිය ශාසන පරමාර්ථය සපුරා ගැනීම සඳහා ප්‍රතිපත්ති පූර්ණයෙහි නිරත වන දිනයකි. බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයෙහි උන්වහන්සේ වෙතින් යෝග්‍ය කරමස්ථාන ලබාගෙන විවේකස්ථානයක සිට මාර්ගඵලාවබෝධය ලබා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ප්‍රකාශ කළ උදන ථෙරගාථා හා අපදන ග්‍රන්ථවල එන උදනයන්ගෙන් දැක ගැනීමට පුළුවන. ඇසල පොහෝදින වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කරනු ලබන්නේ මෙදිනය. වස් විසූ හැම භික්ෂුවක්ම මහා පවාරණ විනය කර්මයට සහභාගි වීම පිළිගත් විනය සම්ප්‍රදයයි. කඨින චීවරය ඇතිවීම සඳහා යෝග්‍ය වන්නේ වස් ශික්ෂා පදය මැනවින් ආරක්ෂා කොට මහාපවාරණ විනය කර්මයෙන් පවාරණය කිරීමෙනි.

බිනර පොහෝදින වස් පවාරණය කිරීමෙන් අනතුරුව එළඹෙන්නේ කඨින චීවර මාසයයි. බෞද්ධ සැදූහැවතුන් විශේෂ උනන්දුවකින් කරන කඨින චීවර දනමය පින්කම බෞද්ධ ලෝකයේ ඉතා ජනප්‍රිය පින්කමකි. කඨින චීවරයක් සමග භික්ෂු සංඝයාගේ පරිහරණය සඳහා අවශ්‍ය භාණ්ඩ පූජා කරන හෙයින් බිනර පොහෝ දිනයේ සිට වස් පොහොය දක්වා කාලය බෞද්ධ සැදූහැවතුන් තුළ දනය පිළිබඳ ආකල්පය දියුණු වන කාලයකි.

# සිල් බිඳීමේ ආදීනව

පංචමේ භික්ඛවේ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තායා

මහණෙනි, දුස්සීල වීමෙහි ආදීනව පහකි.

ඒ මොනවාද?

- මහණෙනි, දුස්සීලයා ප්‍රමාදය හේතුවෙන් මහත් වූ භෝග හානියට පැමිණේ.
- මහණෙනි, දුස්සීලයා සමාජයේ අපකීර්තියට පත්වෙයි.
- මහණෙනි, දුස්සීලයා හට නොබියව යහපත් පිරිස් මැදට එළඹිය නොහැක.
- මහණෙනි, දුස්සීලයා සිහිවිකල් වී කලුරිය කරන්නේය.
- මහණෙනි, දුස්සීලයා මරණින් මතු අපාගත වන්නේය.

**විශුද්ධි මාර්ගය**





# ඕනෑම දෙයක් ඕනෑවට වඩා එපා

දේවදත්ත හිමියන් සංඝ භේදය කොට පලා ගිය දිනයන්හි ආසන්නයෙහි භාග්‍යවතුන් වහන්සේ ගිජු කුල පව්වෙහිදී භික්ෂූන් වහන්සේලා අමතා මෙවන් දේශනාවක් සිදු කරන්නට විය. ''මහණෙනි, දේවදත්ත තෙරුන්ගේ පරාභවය පිණිස හේතුවූයේ දෙව්දතුන්ට ලාභ සත්කාර හා යසස්ය'' යනුවෙනි.


ලාභ සත්කාර යනු මිනිසාගේ මානය හා මෝහය වර්ධනය වීමට හේතුවන මළ පුඩුවකි. ලාභ සත්කාර හා යසස් ලැබෙන තරමට ඇතැම් පුද්ගලයන්ට තමාගේ ස්ථාවරය හා තමාගේ තත්ත්වය පවා අමතක වී යන්නේ අරුම පුදුම විදිහටය. ලාභ සත්කාර හා කීර්තිනාම ලැබීම තුළ මිනිසා අන්ධයකු බවට පත්කිරීම නිරායාසයෙන්ම සිදුවේ.


මේ බව පෙන්වා දෙමින් මේ කරුණ පැහැදිලි වීම සඳහා බුදුන් වහන්සේ විශේෂ උපමා කිහිපයක් දේශනා කළහ. ඒ අතරින් පළමුවැන්න වන්නේ උණ වනය පිළිබඳව ගෙන ආ උපමාවයි. උණ වනයෙහි උණ ගස්වල මල් පිපීම උණ ගසෙහි විනාශයට හේතු වේ. එපරිදිම කෙසෙල් ගසෙහි විෂයයෙහි ආරම්භයද කෙසෙල් ගස ඵල දැරීමයි. උණ ගසෙහි මල් පිපීමත්, කෙසෙල් ගස ඵල දැරීමත් කීර්ති ප්‍රශංසා ලාභ ලැබීමක් වැනිය. එහෙත් එය විනාශයට ගෙන යාමකි. ලාභ සත්කාර මිනිසාගේ විනාශය හා අපායගාමීත්වය උදාකරනු ලබන්නේ ඒ ආකාරයෙනි.

(අංගුත්තර නිකාය - චතුත්ත නිපාතය, දේවදත්ත සූත්‍රය)

**- සගම අනෝමදස්සි හිමි**

''මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''






# කෙනෙකු ලස්සන වෙන්නත් විරූපී හේතුව

සුභමානවක නමැති තරුණයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ උන්වහන්සේගෙන් මෙසේ විමසීය. ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, මනුෂ්‍ය ලෝකයේ ඇතැම් මනුෂ්‍යයන් ඉතාම දුර්වර්ණව, විරූපීව, අවලස්සනව ඉපදීමට හේතුව කුමක්ද? එයට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. සුභමානවකය, මේ ලෝකයේ ඇතැම් මනුෂ්‍යයන් සිටිනවා ස්වල්ප දේට පවා කිපෙන අය. ද්වේශය, පටිඝය, ක්‍රෝධය, වෛරය, තරහා බහුල අයද වෙති. එවැනි අය ඉතා සුළු දේට පවා කිපෙනවා. තමන්ගේ මවුපියන් අවවාදයක් කළත් කිපෙනවා. වැඩිහිටියකු, ගුරුවරයකු අවවාදයක් කළත් කිපෙනවා. තමාගේ වැරැද්දක් පෙන්වා දුන්නත් ඒවා පිළිගන්න කැමැති නැහැ කිපෙනවා. ගිනි අඟුරු ගොඩකට ලුණු කැට දමපුවාම ලුණු පුපුරන්න වගේ කිපෙනවා. නාගයකුට ලීයකින් තැලූ විට නයා පෙනේ පුප්පන්න ලෙසට කිපෙනවා.

කිපිලා නිකන් ඉන්නැහැ. තමන්ට අවවාද අනුශාසනා කරන අයට නින්දා අපහාස අවමන් චෝදනා ආදිය කිරීමට පෙළඹේ. එකට එක කිරීමට යොමුවේ. රණ්ඩු කළකෝලාහලවලද පැටලේ. මේ ආකාරයට නිරන්තරයෙන්ම කිපෙනසුළු පුද්ගලයෝ එම ද්වේශය, වෛරය, ක්‍රෝධය හේතුවෙන් මරණින් මතු බුර බුරා නැගෙන ගිනිජාලා ඇති, හැඬූ කඳුළින් යුතුව හැඬීම්, වැළපීම් ඇති අපායට වැටුණු විට කල්ප කෝටිගණන් අපාදුක් විඳීමට සිදුවේ. යම් කාලයක මේ මනුෂ්‍ය ලෝකයේ ඉපදුණ විට එම අකුසල කර්මය තිබෙන තාක් උපනූපන් බවයක් පාසා බලන්නට පවා අප්‍රිය, අමනාප, පිළිකුල් සහගතව යක්ෂයන්, ප්‍රේතයන් බඳු ශරීර ඇතිව විකලාංගව, විරූපීව තමා හැදූ වැඩූ මවුපියන්ට පවා අප්‍රිය අයකු ලෙස අවලස්සන වී ඉපදේ.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැලණිය**

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# පස් පවින් වැළකුණු පමණින් හොඳ කෙනෙක් වෙන්න බැහැ

පංචශීල ප්‍රතිපදාව සෑම ආගමකම වාගේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්තියකි. එය බුදු දහමේ ඒ නමින් හැඳින්වුවද වෙනත් ආගම්වල වෙනස් ආකාරවලින් දක්වා තිබිය හැකිය. කෙසේ වුවද සෑම ආගමික නායකයකුම පංචශීල ප්‍රතිපදාව ඉගෙන ගෙන තිබෙන්නේ සමාජය තුළිනි. විශේෂයෙන් පංචශීලයෙන් ඉගැන්වෙන වැළකීමේ අංශය සමාජය තුළින් දකින දෑ අවබෝධ කරගැනීම හරහා එය ආගමික නායකවරු ලෝකයට ඉදිරිපත් කළහ.

අපි නිදසුනක් ගනිමු.

මිනිසා ගල් යුගයේ සිට කෘෂි යුගයට එනවිට කෘෂිකාර්මික කටයුතු සඳහා බෙහෙවින් උපකාරී වූ සත්වයකු වූයේ ගවයාය. ගවයා සමග එහිදී මිනිසා සමීප ඇසුරක් පැවැත්වූ නිසා උගේ බඩගින්න, නිදිමත, වෙහෙස, බිය, සංත්‍රාසය, හිංසාවට දක්වන බිය වැනි දේවල් මිනිසාට අවබෝධ කරගත හැකි විය. ඒ අනුව අපට දැනෙන හැඟීම්ම ඌටත් දැනෙන බව වටහා ගනිත්ම ගවයා නොමැරිය යුතු බවට සම්මුතියක් සමාජය තුළින්ම ගොඩනැගිණි. පංච ශීලයෙහි එන පළමු ප්‍රතිපදාව වන සතුන් නොමැරීම ගොඩනැගුණේ එපරිද්දෙනි.

පුද්ගලික දේපළ පිළිබඳ සංකල්පය මිනිසුන් තුළ ඇති වුණේ කෘෂි යුගයේදීය. කැලයේ ජීවත් වීමේදී කැලය හැම දෙනාටම සමසේ අයිති විය. නමුත් ගොවිතැන් කිරීමේදී මිනිසුන් තමන්ගේ කියා කොටසක් වෙන්කර ගැනීමට පෙළඹුණි. ඒ අනුව තමන් විසින් වෙන්කර ගන්නා ලද කොටස තව කෙනෙක් පැහැර

> ''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

ගන්නවාට මිනිස්සු අකමැති වූහ. ඒ අනුව එය වරදක් බවට සමාජ සම්මුතියක් ඇති විය.

සොරකම් නොකිරීම යන දෙවන ශික්ෂා පදය සමාජය තුළට පිවිසියේ එපරිද්දෙනි.

කෘෂි යුගයේදී ගොවිතැන් කටයුතු සඳහා ගෙහිමියා නිවසින් නික්ම ගිය පසු ගෙදර දොර හා දරුවන් බලා කියාගෙන නිවසේ රැඳී සිටියේ ගෘහණියයි. එවැනි කාන්තාවක් පමණක් සිටින නිවසකට අන් පුරුෂයකු ගොස් කරදර කිරීම නොමනා හා නොකළ යුතු ක්‍රියාවක් බවට සමාජ සම්මුතියක් ඇති විය. තෙවන සිල් පදය වන කාමයෙහි වරදවා නොහැසිරිය යුතුය යන්න බිහිවීමට පාදක වූයේ එයයි.

කෙනෙකු මහන්සියෙන් උපයා සපයා ගත් දේ තව කෙනෙකු විසින් සොරෙන් පැහැර ගැනීම නොකටයුතු ක්‍රියාවක් ලෙස සමාජය අවබෝධ කරගත් නිසා සිව්වන සිල් පදය බිහි විය.

කෘෂි යුගයේදී සිරුර වෙහෙසා වැඩ කරන පිරිමින් වැඩ කටයුතු අවසානයේ මත්පැන් ටිකක් ගත්තේ ඇගේ මහන්සිය යන්නටය. පසුව ඔහු ඉබේම එහි වහලෙකු බවට පත්ව අවසානයේ කායික මළානික කුසීත බව, කල්පනා ශක්තිය මොට වීම, සිරුර වෙහෙසා වැඩ කිරීමේ හැකියාව නැතිවී යාම වැනි බොහෝ අහිතකර ප්‍රතිවිපාක අත්පත් කරගත්හ. සුරාපානය නොකළ යුත්තක් බවට සම්මුතියක් ඇති වූයේ එලෙසිනි. ඒ පස්වන සිල්පදය බිහිවීමට හේතුපාදක වූ කාරණාවන්ය.

බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වනවිටත් මේ සම්මුතිය සමාජය තුළ පැවතිණි. ඒ අනුව ශීලය යනු සමාජය තුළ එදත් පැවැති දෙයක් මිස බුදුරජාණන් වහන්සේ විසින් පළමු වරට හඳුන්වා දුන් දෙයක් නොවේ.

සෑම ආගමකම පංචශීල ප්‍රතිපදාව යම්තාක් දුරට පැවැතියත් බුදු දහම ඒ ප්‍රතිපදාවන් තුළ තවදුරටත් ඉදිරියට ගිය ඉගැන්වීමකින් යුතුය. ඒ අනුව බුදු දහමේ විරමනය සහ සමාදානය ලෙස කරුණු දෙකක් දක්වා ඇත. **විරමනය** යනු වැළකීමය. එය ඕනෑම ආගමක තිබිය හැකිය.

**සමාදානය** යනු කැමැත්තෙන් වැළඳ ගැනීමය.

ඒ අනුව වළකින්නේ නරක දේවල්වලිනි. වැළඳ ගන්නේ හොඳ දේවල්ය. නරක දෙයින් වැළකී සිටියාට මදිය. හොඳ දේ වැළඳ ගැනීමද කළ යුතුය.

**"මම සියලු නරක පුරුදුවලින් වැළකිලා ඉන්නේ. ඒ නිසා මං හොඳ කෙනෙක්."**

සමහරු මෙසේ තමා පිළිබඳව ආත්ම වර්ණනා කරති. නමුත් කිසිම නරක වැඩක් නොකර සිටීම යනු නරක නෑ යන්නය. නරකින් වැළකුණු පමණින් හොඳ වන්නේ නැත. හොඳ වන්නට නම් හොඳ දේවල් කළ යුතුය. නිදසුනක් ලෙස කතා කරන්නට බැරි ගොළු මිනිසකු කවදාවත් බොරු කියන්නේ නැත. ඒ කතා කරන්නට බැරි නිසාය. එය හොඳක් නොවේ. නරක නැතිකම පමණි. නරකින් වැළකීම සහ කැමැත්තෙන් වැළඳ ගත යුතු සාරධර්ම වැළඳ ගැනීම යන මේ දෙකෙන්ම පෝෂණය වීම හොඳ යන්නෙන් අදහස් කෙරේ. බුදුරජාණන් වහන්සේ සබ්බ පාපස්ස අකරණං යන ගාථාවෙන් දේශනා කළේ එයයි.

**"සබ්බ පාපස්ස අකරණං**
**කුසලස්ස උපසම්පදා**
**සචිත්ත පරියෝ දපනං**
**ඒතං බුද්ධානසාසනං."**

"සියලු පව් දුරු කරන්න. කුසලය (සිත දියුණු කරවන, සිත පිරිසිදු කරන, සිතේ දක්ෂතාව ඇති කරන සිතිවිලි) දියුණු කරන්න. ඒ තුළින් පරිපූර්ණ පුද්ගලයකු බිහි වෙයි" යන්න එහි අදහසය.

ඒ අනුව, හොඳත් නැති කරගත් පුද්ගලයකු බිහිවී එලක් නැත. එය හරියට පතෝල මෙනි. නරකින් වළකින සේම හොඳ දේ දියුණු කිරීම යන මේ කරුණු දෙක තුළින් පරිපූර්ණ මිනිසකු බිහිවෙයි. පංචශීල ප්‍රතිපදාවෙහි එන නරක දෙයින් වැළකීමේ පැත්ත අනුගමනය කරනු සේම කැමැත්තෙන් දියුණු කරගත යුත්තේ මොන ගුණාංගයද යන්න ගැන ඔබට අවබෝධයක් තිබිය යුතුය.

**ධර්ම ගවේෂක**



"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# සැමියාට මත්පැන් බීමට උදව් කිරීමත් පස්වන සිල් පදය කැඩීමක්

පංච ශීලයෙහි පස්වන හෙවත් අවසන් සිල් පදය වන්නේ ''සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාධියාමි'' යන්නය.

සුරාව යනු මද්‍යසාර වේ. එය මද්‍යසාර, මත්ද්‍රව්‍ය ඇතුළු සියලුම මත්වන ඒවා ලෙස සැලකිය යුතුය. මේරය යනු මත්වීමයි. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී යන සිල් පදයෙහි අරුත එකට කැටි කර ගත් කල එය දැක්විය හැක්කේ මෙසේය.

මදයට හා ප්‍රමාදයට හේතුවන කාරණයක් වන බැවින් මද්‍යසාර මත්ද්‍රව්‍ය ඇතුළු සකලවිධ මත්වන දේවල්වලින් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

පන්සිල්වල ඉගැන්වෙන ඉතා ප්‍රබලම සිල්පදය වන්නේත් මෙයයි. මෙහි මදය, කායිකව ඇතිවන පසුබෑම ලෙසත්, පමාදය මානසිකව ඇතිව පසුබෑම ලෙසත් අර්ථ දැක්විය හැකිය. කායික හා මානසික පසුබෑම යන දෙකම එකවර ක්‍රියාත්මක වන මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය මනුෂ්‍ය ශරීරයට බෙහෙවින්ම අහිතකරය.

මනුෂ්‍යයා ශ්‍රේෂ්ඨත්වයට පත්වන්නේ මනසිනි. එම ශ්‍රේෂ්ඨත්වය වැනසී යාමට මුල් වන දෙයක් ලෙසත්, බරපතළ දුරාචාරයක් ලෙසත් මත්පැන් සැලකිය හැකිය. එපමණක් නොව, මිනිසා භෞතිකව එනම් කායිකව මෙන්ම ආර්ථික වශයෙන් දුර්වල කිරීමටද මෙය එකසේ බලපායි. මේ බරපතළ තත්ත්වය සලකා සිල්පද කැඩීමෙන් වන ආදීනවයද අවධාරණය කරමින් වදාළ එකම සිල් පදය ලෙසින් බුදුරජාණන් වහන්සේ මෙය දේශනා කොට තිබේ. සිල්පදය කැඩීමෙන් වන ආදීනවය සිල්පදයට ඇතුළත් කොට ඇත්තේ ඉහතද සඳහන් කළ පරිදි මදයට හා ප්‍රමාදයට හේතු කරවන යනුවෙනි.

නමුත් මත්පැන් පානය කරන්නන් වර්තමානයේ මෙම සිල්පදය තමන්ගේ වාසියට හරවාගෙන විකෘති කර තිබේ. එහි මජ්ජ පමා යන පාලි පාඨයෙහි අදහස මදයට හා ප්‍රමාදයට යන්න වුවත් මත්පැන් ලෝලීන් එය මඳ පමණින් යනුවෙන් දක්වමින් මුළුමනින්ම අරුත විකෘති කොට ඇත. බුදුරජාණන් වහන්සේ මිනිසුන්ට මුළුමනින්ම මත්පැනින් බැහැර වන්නට ධර්මය දේශනා කළා මිස මත්පැන් මඳ පමණින් ගන්නැයි දේශනා කොට නැත.

බුද්ධ දේශනාවට අනුව මිනිසාගේ පරිහානිය ඇති කරවන ප්‍රධානතම කාරණාවක් වන්නේද මත්පැන්ය. මේ පස්වන සිල්පදය උල්ලංඝනය කරන තැනැත්තාට කිසිදු බයකින්, හිරිකිතයකින් තොරව අනිකුත් සිල්පද සියල්ලම උල්ලංඝනය කළ හැකිය.

මද්‍යසාර භාවිතයෙන් විකෘති වූ මානසිකත්වය ඇති පුද්ගලයා නිරන්තරයෙන් හිංසන ක්‍රියාවන්ට පෙළඹීමට තිබෙන ඉඩකඩ වැඩිය. ඒ තුළ සත්ව හිංසනය, සත්ව ඝාතනය පහසුවෙන් සිදුවිය හැකිය. එය පළමු සිල්පදය බිඳීමකි.

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

එසේම මත්පැන්වලට ඇබ්බැහි වූ පුද්ගලයකුට මුදල් හිඟ වුවහොත් මුදල් සොරකම් කිරීමට වුව ඔහු පසුබාන්නේ නැත. ඒ දෙවන සිල්පදය බිඳීම වේ.

මත්පැන් නිසා මනස විකෘති වෙයි. මෙම විකෘති මානසිකත්වය නිසා තමන්ගේ පහත් ආශාවන් විවිධ දුරාචාරයන් තුළින් මුදුන් පමුණුවා ගැනීමට වෙහෙස දරනු ඇත. තෙවන සිල්පදය බිඳෙන්නේ එලෙසිනි.

මත්පැන් පානය කළ බොහෝ දෙනකු තුළ දැකිය හැකි දෙයක් වන්නේ පාලනයක් නැතිව කතා කරන බහයි. මේ නිසා නොයෙකුත් මුසාවාද කීමද මත්පැන් පානය කළ අය තුළ පොදුවේ දැකිය හැකිය. ඒ අනුව සිව්වන සිල්පදයද බිඳෙනු ඇත.

මෙසේ සලකා බලන විට පස්වෙනි සිල්පදය උල්ලංඝනය කරන්නා වෙතින් අනෙක් සිල්පද හතරම පහසුවෙන් උල්ලංඝනය වනු ඇත.



සුරාපානයෙන් වළකින්නා සිහි කල්පනාවෙන් වැඩ කටයුතු කරයි. කායික හා මානසික නිරෝගීභාවය රැකගැනීම කෙරෙහි උනන්දු වෙයි. කුසීත කමින් තොර බැවින් ක්‍රියාශීලී පුද්ගලයකු වෙයි.

මේ අනුව පස්වන සිල්පදය සමාදන් වන්නකු සුරාව වැනි දුරාචාරයන්ගෙන් වළකින අතරේම තමා තුළ දියුණු කරගත යුතු සිහිකල්පනා ඇති බව වටහා ගන්නා අතරම වීර්යයෙන් කටයුතු කිරීම සහ කායික සහ මානසික නිරෝගී බව පිළිබඳවද සැලකිලිමත් වනු ඇත.


**සුරාපානයේ ආදීනව 5 කි.**

1. **සන්දිට්ඨිකානි ධනඤ්ජානි**
   බලා සිටියදීම පරිහානියට ලක්වීම මින් අදහස් කෙරේ.
2. **කලහප්පවඩ්ඪනි**
   අනවශ්‍ය කලහ ඇතිකර ගැනීම.
3. **රෝගානං ආයතනං**
   විවිධ ලෙඩ රෝග හැදෙන්නට ප්‍රධාන හේතුවක් වීම.
4. **කෝපීං නිද්ධංසිනී**
   සැඟවිය යුතු තැන් නොසඟවා ප්‍රදර්ශනය කිරීම හෙවත් ලජ්ජා භය නැති වීම.
5. **පඤ්ඤාය දුබ්බලීකරණී**
   ප්‍රඥාව දුර්වලවීමය. එනම් හොඳ නොහොඳ කල්පනා කරන්නට තිබෙන ඥාන ශක්තිය මොට වී යාමයි.

මෙසේ ප්‍රබල ආදීනව පහකින් යුක්ත වන බැවින් මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුළුමනින් වැළකිය යුතුය. සැමියා මත්පැන් භාවිතයෙන් වළක්වා ගන්නට ගෘහණියක් උපරිමයෙන් කටයුතු කළ යුතු වෙයි. සමහර බිරින්දෑවරු සැමියාගේ මත්පැන් පානය සාධාරණීකරණය කිරීමට උත්සාහ කරති. ''බිව්වට එයා අපිට කිසිම කරදරයක් කරන්නෙ නෑ. ඒ වෙලාවට හරියට පොඩි ළමයෙක් වගේ. අපට කිසි අඩුපාඩුවක් කරන්නෙත් නෑ'' ආදී වශයෙන් මෙවැනි භාර්යාවන් කියනු අසන්නට ලැබේ. ඒ වගේම සමහර පවුල්වල සැමියා මත්පැන් බොන විට කටගැස්ම හදා දෙන්නේ භාර්යාවය. මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුත්තක් තිබේ. සැමියාගේ මත්පැන් බීම සාධාරණීකරණය කිරීම සහ ඔහුට කටගැස්ම හදා දීමෙන් බිරිඳ කරන්නේද පස්වෙනි සිල්පදය බිඳ ගැනීමය.

ගවේෂක

# අප කරන හැම පවක්ම පල දෙනවාද?





අප කළ හැම පාපයකම විපාක අපට ඒකාන්තයෙන්ම ලැබෙන්නේද යන්න බොහෝ දෙනා විමසන පැනයකි. ධර්මයට අනුව සිත සහ පව කර්ම හෙවත් සංස්කාර වශයෙන් දක්වා තිබේ. විපාක පිණිස සැකසෙන කර්ම සංස්කාර වෙයි. විපාක යනු නරක විපාක පමණක් නොවේ. යහපත් දේවල්වලට හොඳ විපාකත්, අයහපත් දේවල්වලට නරක විපාකත් ලැබෙනු ඇත. හොඳ විපාක පිණිස සැකසෙන කර්ම පුඤ්ඤාභි සංඛාර ලෙසින්ද, නරක විපාක පිණිස සැකසෙන කර්ම අපුඤ්ඤාභි සංඛාර ලෙසින්ද බුදු දහමේ විස්තර වේ. සරලව කිවහොත් විපාක පිණිස සැකසෙන්නේ අප විසින්ම සිදුකරනු ලබන පින් හෝ පව්ය.

නමුත් සෑම නරක සිතිවිල්ලක්ම නරක විපාක ගෙන දෙන්නේ නැත. එයට හේතුව නරක සිතිවිල්ලක් සිතට ආ පමණින් ඒ තුළ කර්මයක් සැකසෙන්නේ නැති නිසාය. විපාක පිණිස කර්ම සැකසෙන්නේ එම නරක සිතිවිල්ල සිතින්, කයින් හෝ වචනයෙන් ක්‍රියාත්මක කිරීමට යාම තුළය. මෙහිදී එම නරක සිතිවිල්ල සිතින් ක්‍රියාත්මක කිරීම යනුවෙන් අදහස් කරන්නේ ඒ සම්බන්ධව නැවත නැවත සිතමින් සැලසුම් කිරීමයි.

කෙසේ වුවද කිසියම් හෝ කර්මයක හිමිකාරයා වන්නේ, ඒ ක්‍රියාව හා බැඳුණු සිත ඇති තැනැත්තාය. නිදසුනක් ලෙස යමකු සතකු මරන්නේ යැයි සිතමු. එම මරණ සිත තිබෙන්නේ මරණ පුද්ගලයාටය. ඒ මරණ ක්‍රියාව බලා හිඳ තවත් කෙනකු සතුටින් එය අනුමත කරන්නේ නම් හෝ ඒ පිළිබඳව හටගත් ශෝකය මත ඒ පුද්ගලයා සමග ගැටීමක් ඇතිකර ගන්නේ නම් එසේ සතුටින් අනුමත කිරීම හෝ දුකින් ගැටීම තුළ එම පුද්ගලයා පාප කර්මයක් සිදුකර ගනු ඇත. නමුත් එය මරණ ක්‍රියාව සිදු කරන්නාට අත්වන ප්‍රාණඝාත අකුසල කර්මය තරම්ම බලවත් එකක් නොවේ. සත්ව ඝාතන ක්‍රියාව දෙස බලා සතුටු වීම යනු පව් අනුමෝදන් වීමයි. ගැටීමක් ඇතිකර ගැනීම තුළ ඇත්තේ ද්වේශයක් නිසා එයද පාප කර්මයකි.

මෙසේ තමන් සෘජුව ප්‍රාණඝාත ආදී අකුසල කර්ම නොකළත් අනුන් කරන ඕනෑම පාප කර්මයක් දෙස බලා සතුටු වීමෙන් බොහෝ අය පව් සිදුකර ගනිති. එසේම එම නරක ක්‍රියා අනුමත නොකළත් ඒවා කරන තැනැත්තා සමග මානසිකව හෝ ගැටීමද පාප කර්මයකි. ඒවා මනෝ කර්ම නම් වේ.

මෙකල බොහෝ දෙනා කයින් හා වචනයෙන් රැස්කරන පාප කර්මවලට වඩා මනසින් රැස්කරන පාප කර්ම වැඩි බව පෙනේ. සැබැවින්ම මෙහිදී ඔවුන් සිදුකර ඇත්තේ අනුන්ගේ පවකට කර ගැසීමය. මෙබඳු කර්මවලට දායක වීම නිසා ප්‍රාණඝාත අකුසලය තරම්ම භයානක ප්‍රතිඵලයක් නොලැබුවද එයට සමීප ප්‍රතිවිපාකයක් ලැබිය හැකිය.

මේ තත්ත්වය වළක්වා ගත හැක්කේ අපටමය. අප කරන සියලුම පින් හා පව්වලට අපම වගකිව යුතු වේ. එය කිසිදු බාහිර හේතු කාරණාවකින් සාධාරණීකරණය කළ නොහැකිය. අප විසින් සිදුකරන හොඳ හෝ නරක කර්ම සියල්ල අපට දායාද පිණිස උරුම වෙයි. මෙය කම්මදායාද නමින් දහමේ දැක්වේ.

මෙසේ අතීතයේ කරන ලද දේවල් අතීත දායාද

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.



වශයෙන් උරුම වුවත් වර්තමාන ක්‍රියාකාරිත්වය තුළ එම කර්මදායාදයන් වෙනස් කළ හැකිය. තමන් ජීවිතයේ සිදු කරනු ලබන කර්මවලට තමන් වගකිව යුතු සේම ඒ කර්ම වෙනස් කළ හැක්කේද තමාටමය. මේ ගැන අපි තව ටිකක් පැහැදිලි කර ගනිමු.

බෞද්ධයෝ අපලවලට බෝධි පූජා තබති. අපල යනු එක්තරා අතකින් බැලූවිට අප අතීතයේ කළ නරක කර්ම විපාක දෙන කාලයයි. එනම් හොඳ කර්ම පළ නොදෙන කාලයයි. මෙසේ තමන්ගේ දරුවකුට අපල කාලයක් එළඹී ඇති විට සමහර මවුවරුන් එම දරුවා වෙනුවෙන් බෝධි පූජා තබන්නේ දරුවාටද නොදන්වාය. මෙලෙස ආශිර්වාදය ලැබිය යුත්තාට නොදන්වා කරන ආශිර්වාදවලින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත. ඔහුට එම ආශිර්වාදය ලැබෙන්නේ බෝධි පූජාව තබන අවස්ථාවේ එතැන සිටියේ නැතත් ඔහු එය දැනගෙන මනසින් හෝ ඊට සම්බන්ධ වීමෙනි. ඒ බෝධි පූජාවට සම්බන්ධ කුසල චේතනා මනසේ පහළවීම තුළිනි. කුඩාම දරුවකු නම් එම ස්ථානයේ තබාගෙන ආශිර්වාද කිරීමෙන් එම පින ලැබිය හැකිය.

පන්සලට බුදු පිළිම වහන්සේ නමක් පූජා කරන ලද අයකු එහෙමත් නැත්නම් බුදු ගෙයක් සාදා දුන් අයකු සැදැහැවතුන් එය වන්දනා කරන මොහොතක් මොහොතක් පාසා තමන්ට ඉබේම පින් ලැබේවි යැයි සිතීම වැරදිය. එලෙස පින් ඉබේ ලැබෙන්නේ නැත. තමා කළ ඒ කුසල ක්‍රියාව සහ සැදැහැවතුන් එය වන්දනාමාන කරන අන්දම නිතර සිතින් මෙනෙහි කිරීමෙන් ඒ ගැන සතුටු වීමෙන් පින ලැබෙනු ඇත.

අප කළ පාප කර්මවල විපාක වළක්වා ගන්නට පුළුවන. අප කරන හැම පාප කර්මයක්ම ඒකාන්තයෙන්ම විපාක දෙන්නේ නම් දුටුගැමුණු රජුට දිව්‍යාත්ම භාවයක් ලබන්නට නොහැකි වනු ඇත. අංගුලිමාල රහත් භාවය ලබන්නේද නැත. නමුත් මෙසේ කියූ පමණින් ඔබ පාප කර්ම විපාක දෙන්නේ නැහැ යැයි කියමින් තව තවත් වැරදි කළොත් ප්‍රතිවිපාක බිහිසුණු වීමට පුළුවන. එසේ නම් කරන ලද පාප කර්මවලට විපාක නොදෙන්නේ කවර ආකාරයෙන්ද යන්න මඳක් විමසා බලමු.

පාප මිත්‍ර සේවනය නිසා හෝ ආවේග පාලනය කරගැනීමට නොහැකි වීම මත හෝ නොමනා පෙළඹවීමක් නිසා හෝ ඔබ අතින් වරදක් සිදුවුණේ නම් එම වරද නැවත කිසිවිටෙකත් නොකරන්නෙමි යන ආයත සංවරයේ පිහිටා පාප කර්ම වෙනුවට වඩ වඩා පින්කම් කළ යුතුයි. එමගින් නරක විපාක ලැබීම වළක්වා ගත හැකි වේ.

නමුත් මොනතරම් ප්‍රබල කුසල කර්ම සිදු කළත් මව මැරීම, පියා මැරීම ආදී වශයෙන් වූ ආනන්තරීය පාප කර්ම කළ අයකුට නම් විපාක ලැබීම වෙනස් කළ නොහැකිය. ආනන්තරීය පාප කර්ම පහෙන් එකක් කළත් මරණින් මතු ඒකාන්තයෙන්ම අවීචි මහා නරකාදියේ උපත ලැබීම කර්ම නියාමයකි.

එය එසේ වුවද ඉහත සඳහන් කළ අනිකුත් කරුණුවලට අනුව බලන විට බුදු දහමේ ඉගැන්වෙන කර්මය යනු නියති වාදයක් (ඒකාන්තයෙන්ම සිදුවන්නක්) නොවන බව පැහැදිලි වනු ඇත.

**පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි**
**සාකච්ඡා කළේ : ඉන්දු පෙරේරා**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''




ධර්ම දේශනය

# සිතෙහි එකඟතාව ඇති කරන මෛත්‍රියෙහි අනුහස්

"සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති. මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගිං වා විංස වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති"

(අඞ්ගුත්තර නිකාය - මෙත්තානිසංස සූත්‍රය)




දේශකයාණෝ : ශ්‍යාමෝපාලි
මහානිකායේ මල්වතු මහාවිහාර
පාර්ශ්වයේ විංශද්වර්ගික
කාරක සංඝ සභික
පූජ්‍ය තිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර
තේවාවහාර නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ


පින්වත්නි,

වස්සාන සමයට අයත් මාසයක් වන බිනර මාසය බොහෝ පින්කම් පැවැත්වෙන සෞම්‍ය දේශගුණයෙන් යුතු පැහැබර මාසයකි. එම මාසයට යෙදෙන බිනර පුන් පොහෝ දිනය බෞද්ධයන්ට සුවිශේෂී පොහෝ දිනයකි. සම්බුද්ධ ශාසනයේ මෙහෙණි සස්න බිහිවූයේ ඒ උතුම් බිනර පොහොය මුල්කරගෙනය. මහාප්‍රජාපතී ගෝතමී තොමෝ ගරුධර්ම අටක් හිස්මුදුනින් පිළිගෙන මහණ උපසම්පදාව ලබා මෙහෙණි සස්න ඇති කළේ මේ උතුම් පොහොය දිනයේය. සීලාදී ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙන මෙම උතුම් පොහෝ දිනයේ දී මෙත්තානිසංස පිළිබඳව සිහිපත් කිරීම මෙලොව, පරලොව යහපත පිණිස හේතුවේ.

අඞ්ගුත්තර නිකායේ මෙත්තානිසංස සූත්‍රයේ මෙත්තානිසංස එකොළොසක් දැක්වේ. එනම් සුවසේ නිදීම, සුවසේ පිබිදීම, ලාමක නපුරු සිහින නොදැකීම, මිනිසුන්ට ප්‍රිය වීම, අමනුෂ්‍යයන්ටත් ප්‍රිය වීම, දෙවියන් විසින් රකිනු ලැබීම, ගිනි හෝ විෂ හෝ ආයුධ හානි සිදු නොවීම, සිත වහා සමාධියට හෙවත් එකඟ බවට පත්වීම, මුව පැහැපත් වීම, නොමුලාව, සිහි ඇතිව කලුරිය කිරීම, මතු මගඵල නොලද හොත් බඹලොව උපත ලැබීම යනුයි. ඒ මෙත්තානිසංස සූත්‍ර නිධාන කථාව මෙසේය.

අප සම්මාසම්බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩසිටින කාලයේ දී දිවැසින් බලා වදාළ පරිදි, තමන් වහන්සේ කොසොල් රට සැරිසරන කාලයෙහි අග්ගික්ඛන්දොපම සූත්‍රය දෙසීමෙන් ඒ ධර්මය අසා, සැටනමක් පමණ භික්ෂූන් රහත් භාවයට පැමිණෙන බවත්, සැටනමක් පමණ භික්ෂූන් කටින් ලේ වහනය කරන බවත්, සැටනමක් පමණ භික්ෂූන් සිවුරු හැර යන බවත් දැක කොසොල් රට වඩින ගමන නොනවතා වඩින ගමනේ දී එක්තරා බෙනයක් සහිත ගසක් ගින්නෙන් ඇවිලෙනු දැක භික්ෂූන් වහන්සේ අමතා, ඒ ඇවිළුණු ගින්න දක්වා අග්ගික්ඛන්දොපම සූත්‍රය දේශනා කොට වදාළ සේක. එම දේශනාව අවසාන වනවාත් සමඟම සැටනමක් භික්ෂූන් රහත් වන්ටත්, සැටනමක් භික්ෂූන් ලේ වමනය කරන්නටත්, සැටනමක් භික්ෂූන් සිවුරු හැර යන්නටත් පටන් ගත්හ. මීට හේතු වශයෙන් උන්වහන්සේ, කුඩා කුඩා සිල්පද කඩ කළ භික්ෂූන් වහන්සේලා සිවුරු හැරගිය බවත්, පාරාජිකා

"සියල්ලෝ දඬුවමට තැති ගනිති. සියල්ලෝ මරණයට බිය වෙති. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය

සිල්පද කැඩූ භික්ෂූන් වහන්සේ ලේ වමනය කළ බවත්, නියම ලෙස දහම් පිරූ භික්ෂූන්වහන්සේලා රහත් වූ බවටත් විස්තර කොට වදාළ සේක. යම්කිසි භික්ෂුවක් භික්ෂුත්වය ලබාගෙන ඒ භික්ෂුත්වයට අයත් ගුණධර්ම පිළිපදින්නේ නැත්නම් ලෝකවාසීන් ශ්‍රද්ධාවෙන් පූජා කරන දේ ප්‍රයෝජනයට ගනිත් නම් එය ලොකු වරදක් බවත්, එය ගිනිගොඩට පැනලා ජීවිත හානි කර ගැනීමට තරම් වරදක් බවත් දක්වා වදාරණ ලද සේක.

මේ දේශනාව අවසන් වී ජේතවනාරාමයට වැඩම කරන විට ඉහත දේශනය ශ්‍රවණය කළ භික්ෂූන් කණ්ඩායම් වශයෙන් සිවුරු හැර ගොස් තිබිණ. මෙසේ පරිහානියක් වීමට හේතු කවරේදැයි භික්ෂූන්වහන්සේ ආනන්ද හිමිගෙන් විමසූ විට උන්වහන්සේ බුදුන්වහන්සේගෙන් ඊට කාරණා විමසමින්, භාග්‍යවතුන්වහන්ස, ඔබවහන්සේ කොසොල් රට සැරිසරන අවස්ථාවෙහි බෙණයක් සහිත විශාල ගසක් ගිනිගෙන දැවෙනු දැක දේශනා කළ අග්ගික්ඛන්දොපම සූත්‍ර දේශනාවට සවන් දුන් භික්ෂූන්වහන්සේගෙන් සැටනමක් ඒ අවස්ථාවෙම රහත් වූහ. සැටනමක් ලේ වමනය කළහ. සැටනමක් සිවුරු හැරගියහ. මේ ආරංචිය සැල වූ අනෙක් භික්ෂූන්වහන්සේලාත් ඔබවහන්සේගේ දේශනාවේ බරපතලකම තේරුම්ගෙන දැනටමත් සිවුරු හැරයමින් සිටිති. මෙය ඇසූ බුදුරජාණන්වහන්සේට ධර්ම සංවේගයක් ඇති වී, ආනන්දය, ශාසනයට ඇතුල් වීමට කොතෙකුත් මාර්ග ඇත. එබැවින් එකම මාර්ගයක් නිසා මාගේ ශාසනය විනාශ වූවායැයි සිතන්නට නුපුළුවන. සියලුම විහාරවල භික්ෂූන් ජේතවනාරාමයට කැඳවා ධර්මාසනයක් පනවා, මහණෙනි මේ ශාසනයේ යම් භික්ෂුනමක් අසුරුසනක් ගසන ස්වල්ප කාලයක් නමුදු සියලු සතුන් කෙරෙහි මෙත්සිත වඩයි නම්, ඒ භික්ෂුනම සසුනේ ධ්‍යානයෙහි නොසිස්ව වාසය කරති. ශාස්තෘ ශාසනය පිළිපදින්නේය. ශාස්තෘ ශාසනය පිළිගත්තෙක් වන්නේය. රටින් ලැබෙන ආහාර නොසිස්ව වළඳයි. මහණෙනි, අසුරුසනක් ගසන කාලයක සිත කෙලෙසුන් මිදීම හෙවත් මෛත්‍රීචේතෝවිමුක්තිය වඩයි ද, ඒ භික්ෂුව නොසිස් වූ ධ්‍යානයෙන් යුක්තව වාසය කරයි. යමෙක් එය බහුලව කරයි ද එසේ නම් කවර කථා ද? මෛත්‍රියෙන් සිත සමන්විත වූ විට ප්‍රීතිය උපදවයි. හිතවත් පුද්ගලයාය, මිත්‍රයාය යනුවෙන් සිත සියලු සත්වයන් කෙරෙහි එක හා සමානව පැවැත්වීම මෛත්‍රියයි. කලින් භික්ෂූහු ප්‍රතිපත්ති වලින් පිරිහී සිටීම නිසා උණු ලේ වමනය කිරීමාදී හානි සිදුවූ නමුත්, මෙත් සිතින් භික්ෂු ප්‍රතිපත්ති පුරන අය ලෝකවාසීන් ශ්‍රද්ධාවෙන් දෙන දෙය පිළිගැනීමට සුදුසු පරිදි මගඵල ලැබූහ. මේ ප්‍රකාශයත් සමඟ කලකිරීමට පත්ව සිටි භික්ෂූන් මෛත්‍රී සහගත සිතින් කෙලෙස් දහම් දුරු කොට ලබන ලද ආනිසංස මෙත්තානිසංස සූත්‍රයේ පරිදි ඉහත දක්වන ලදී.

මෛත්‍රිය පියවරෙන් පියවරට පිරිය යුත්තකි. එය කොතරම් අගේද යත් බුදුවීමට මෛත්‍රී පාරමිතාව ද පිරිය යුතුය. වෛරය, පළිගැනීම අමතක කොට මෛත්‍රිය පිරිය යුතුය. මෛත්‍රිය වැඩීමට තරාතිරමක් නොමැත. අවස්ථාවක් ද නොමැත. මෛත්‍රිය වඩන්නාටත්, එයට පාත්‍ර වන්නාටත් යන දෙදෙනාටම යහපතක් සිදු වේ. වෛරයෙන් තොරව සමගි සම්පන්නව සමමෙත් සිතින් ජීවත් වීම මෛත්‍රියේ ඉහළම ප්‍රතිඵලයයි.


ලෝකයේ සැමදෙනාම තමන්ගේ සැපයට, ලාභයට, දියුණුවට කැමතිය. එසේම තමන්ගේ සැපයට, දියුණුවට, ලාභයට මෙන්ම තමන්ට සතුරු වූත්, මිතුරු වූත්, මධ්‍යස්ථ වූත් හැමදෙනාගේ දියුණුව, ලාභය, සැපය කැමති වීම නිසි මෛත්‍රියයි. අනුන්ගේ යහපත පිළිබඳව සතුටු වීම, අනුන් නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වායි මෛත්‍රී සිතින් සිතීම මෛත්‍රියයි. ඒ සඳහා තරාතිරමක් හේතු නොවේ. තමන්ට හා තමන්ගේ නෑසියන්ට වඩා අන් අය දුකට පත්වූ විට, වැරහැලි ඇඳගත් කිළිටු වූවන් වූ විට, ආහාර පානාදියෙන් තොර වූ විට මෛත්‍රිය පළ කරන්නටත් මැලිවන්නේ නැත. උගත්කම, නූගත්කම, දුප්පත්කම, පෝසත්කම, සුරූපීබව, විරූපීබව, රෝගීබව, නිරෝගීබව මෛත්‍රියට බාධාවක් නොවේ. උපකාරයක් ලාභාපේක්ෂාවක් නොමැතිව අන්‍යයන් කෙරෙහි මෙත්සිත පැතිරවීම නියම මෛත්‍රියයි.

තමා මෙන් අන් සියලු දෙනාම දුකට කැමති නැත. සැපයට දියුණුවට ලාභයට කවුරුත් කැමතිය. එය ලෝක ස්වභාවයයි. මෛත්‍රී සිත් ඇති තැනැත්තා සියලු සත්වයන්ගේ යහපත ප්‍රාර්ථනා කරයි. නිසි සේ මෛත්‍රී කරන්නා ලාභාපේක්ෂාවෙන් තොර වේ. තමාගේ මෛත්‍රිය සිහිපත් කොට සතුටු විය හැක්කෙකි. මධ්‍යස්ථව සිත සියලු සතුන් කෙරෙහි පැවැත්වීම මෛත්‍රියයි. තමන්ට හෝ තමන්ගේ අයට මෛත්‍රී කිරීම වඩා පහසුය. වෛරීන් කෙරෙහි, පළිග ත්තවුන් කෙරෙහි මෛත්‍රී කිරීම ඉතා අපහසුය. තමන්ට, මිතුරන්ට මෙන්ම සතුරන්ට මෛත්‍රී කළ හැකිනම් එය විශාල ජයග්‍රහණයකි. සියලුම සත්වයන් කෙරෙහි සමසිතින් මෙත් සිත පාන්නේ නම් කිසිවෙකුටත් ලෝකය කටුක වන්නේ නැත. මෛත්‍රිය වඩන තැනැත්තන්ට ඉහත කී පරිදි එකොළොස් ආකාරයක ආනිශංස මෙලොවදීම ලැබී සසර දුක නිවාගත හැකිය. සියලු සත්වයන්ට මෛත්‍රී කරන්නාට ලොව කිසි තැනක සතුරන් නොවෙති.

සුවසේ නිදාගැනීමට කෙනෙකුට ලැබෙන්නේ කලාතුරකිනි. මෛත්‍රී සිත් ඇත්තවුන්ට නොගොරවා, කෙඳිරිනොගා, ඒ මේ අත පෙරළීමෙන් තොරව සුවසේ නිදාගැනීමට හැකිය. බොහෝ දෙනා නින්දෙන් අවදිවන්නේ ඈනුම් අරිමින් ඇගපතේ අසීරුකම් කියමින් කෙඳිරිගාමින්ය. එහෙත් මෙත්සිත් ඇත්තවුන් කිසිදු අසීරුවකින් තොරව සුවසේ පිබිදෙයි. බොහෝ දෙනා සිහිනෙන් දරුණු වදහිංසන, සොරුන්, විෂකුරු සර්පයන්, කුළුහරකුන්, දරුණු අනතුරු ආදිය දැක මහත් බියට පත්ව පිබිදෙති. මෙත් සිත් ඇත්තන්ට එවැනි විකාර සිහින නොදැක යහපත් සිහිනම දකිමින් නිදත හැකිය.

මෛත්‍රියෙන් තොරව නපුරුකම්, කුරිරුකම් කරන්නා කාගේත් අපැහැදීමට පාත්‍රවේ. යමෙක් මෛත්‍රී කරන්නාට සතුරු වෙයි ද, වෛර කරයි ද ඒ තැනැත්තා තමා විසින් තමාම සසර දුකට පත්කර ගනී. මෙලොව, පරලොව දෙකෙහිදීම දුකට පත්වේ. රෝසමලක් මෙන් පැහැපත්ව මනුෂ්‍යයන්ට ප්‍රිය උපදන මුහුණු ඇතිව මෙත්සිත් ඇත්තෝ ජීවත් වෙති. මෙත් සිත් වඩන අය මිනිසුන්ට පමණක් නොව අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වෙති. දෙවියන්ට ද ප්‍රිය වෙති. මෛත්‍රිය වඩන තැනැත්තා දෙවියෝත් රකිති. මෛත්‍රියෙන් වාසය කරන තැනැත්තාගේ ශරීරයට කිසිදු පීඩාවක් අත් නොවේ. එසේම මෙත්වඩන්නාගේ සිත සෞම්‍ය බැවින් ඉක්මණින් සමාධියට එකග බවට පැමිණේ. ලේ ධාතුව පිරිසිදු වේ. සිත සතුටින් සපිරේ. මෙත් සිත් ඇති අයගේ මුහුණ පැහැපත්ය. කාන්තිමත්ය. ඔහුට මරණයේ දී බියවීමට කිසිවක් නැත. තමන් කළ පින් ගැන සිහිපත් කොට සිහියෙන්ම යුක්තව කලුරිය කළ හැකිය. එසේම ඔහු මරණින් මතු බ්‍රහ්ම ලෝකයේ උපත ලබන්නාහ.

පින්වලට බය නොවිය යුතුය. පින යනු සැපයටම හේතුවකි. මෙත් සිත් පැතිරවීම ද පිනකි. මෙත් සිත් ඇති තැනැත්තාට කාන්තිමත් රූප සම්පත්තියක් ලැබේ. මෛත්‍රිය භාවනාවක් වශයෙන් ප්‍රගුණ කළ තැනැත්තා, මෛත්‍රී සහගත සිතින් කයින් හොඳනරක කියාදීමත්, කයින් වචනයෙන් අනුන්ට යහපතක් සිදු කිරීමත් හිතවත් අහිතවත් සැමට සමමෙත් සිතින් ඉටුකරති. මෛත්‍රී භාවනාවේ ස්වභාවයයි. සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා යැයි සිතීම සැමදෙනා කෙරෙහි සමව පැවැත්වීම අනුන්ට මෙන්ම තමන්ට ද යහපත්ය. මෛත්‍රියෙන් අන්‍යයන්ට ලැබෙන යහපතට වඩා තමන්ට ලැබෙන යහපත බොහෝය. මෛත්‍රී සිත තිරිසන් සතුන්ට පවා දැනෙනු ඇත. සාමකුමාරයන් වනමෘගයන් සමඟ මිශ්‍රව සිටියේ මෛත්‍රී භාවනාවේ අනුහසිනි. මෛත්‍රියේ අනුසස් මනාව දැන තමන් කෙරෙහි මෙන්ම අනුන් කෙරෙහි ද මෙත් සිත දැක්වීමට මෙම උතුම් පොහෝ දිනයේ දී ඉටාගනිමු.



"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



# එකම පිංකම කරන්නේ දෙන්නෙක්

## පින් ලැබෙන්නේ දෙදෙනාට සමානවමද?

බුදුරජාණන් වහන්සේගේ සමයේ එක්තරා රජතුමකු බුදුරජාණන් වහන්සේට දානයක් පූජා කිරීමට සිතා එම දානය තම සේවකයින් ලවා පිළියෙළ කර බුදුරජාණන් වහන්සේට පූජා කළේය. එම පිනින් රජතුමා මියගිය පසු දිව්‍යමය සම්පත්වලින් අඩුම සම්පත් ඇති චාතුර් මහා රාජිකයේ ඉපදුණේය. එහෙත් එම දානයම තම දෑතින්ම පිළියෙළ කොට බුදුරජාණන් වහන්සේට පූජා කළ රජුගේ ඇමැතියා එම පිණින් වඩාත් දිව්‍යමය සම්පත් ඇති ඉහළ දිව්‍ය ලෝකයක් වූ තව්තිසා දෙව් ලොව ඉපදුණේය. එකම දානය පූජා කළ දෙදෙනාට ආකාර දෙකක විපාක ලැබීමට හේතුව පිළිබඳව භික්ෂූන් වහන්සේලා හේතු විමසන ලදී. එය පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ කියා සිටියේ තමාම පිළියෙළ කර බුදුරජාණන් වහන්සේට පූජා කරන දෙයින් වඩාත් පින් සිදු වන බවය. මෙයින් අවබෝධ කර ගත යුත්තේ එකම පුණ්‍ය කර්මය කරන සියලු දෙනාටම එකම ඵල විපාක හා ආනිශංස නොලැබෙන බවය. එසේ වීමට හේතු රාශියක් බුදු දහමේ දක්වා ඇත.

උදාහරණයක් ලෙස නිවසක දෙන සාංඝික දානයක් ගනිමු. ගෙහිමියා, බිරිඳ, දූ දරුවන්, ඥාතීන් සහ සේවක සේවිකාවන් සාමාන්‍යයෙන් මෙම මහඟු පුණ්‍ය කර්මයට සහභාගි වේ. දානය එකම වුවද මේ එකිනෙකාට ලැබෙන ඵල විපාක හා ආනිශංස එක සමාන නොවේ. ඒ ඔවුන්ගේ සහභාගිත්වය අනුවය. දානමය කුසලයක නම් එහි ඵල විපාක හා ආනිශංස දානයට පෙර සංවිධානයේදී ඇතිවන පූර්ව චේතනාද, දානය පිරිනමන අවස්ථාවේදී ඇතිවන මුඤ්චන චේතනාවද, දානයට පසුව දක්වන අපර චේතනාවද මත රඳා පවතී. දානය දීමේ මූලික අදහස් ඉදිරිපත් කර තමාගේම වුවමනාවෙන් ඉදිරිපත් වී වෙහෙස මහන්සි වී තම මුදල්ද වැය කොට දානය දීමේ කටයුතු කරන ගෙහිමියාට ලැබෙන දානමය ආනිශංස හා ඵල විපාක වැඩිය. දානය යනු තමන් සතු දෙය නිර්ලෝභීව පූජා කිරීමය. මෙහි කුසල් ගෙහිමියාට වැඩි වන්නේ එමනිසාය. එයට හොඳම උදාහරණය වන්නේ කොසොල් රජතුමා දුන් අසදෘශ දානයයි. මෙම දානය දීමේ මූලික අදහස ඇතිවූයේ කොසොල් රජතුමාටය. කෝටි සංඛ්‍යාත ධනයක් වැය කළේ කොසොල් රජතුමාය. එහෙත් එම දානයේ සියලු කටයුතු කළේ මල්ලිකා දේවියයි. එහෙත් ඇයට වඩා වැඩි පිනක් කොසොල් රජතුමාට ලැබිණි. ආමිශ දානයක වැඩිම පින ලැබෙන්නේ තම ධනය නිර්ලෝභීව වියදම් කරන පුද්ගලයාටය. මේ බව හොඳින් දැන සිටි දුටුගැමුණු රජතුමා රුවන්වැලිසෑය නිර්මාණය කිරීමේදී එම සෑයට ගඩොලක් තැබූ භික්ෂූන් වහන්සේ නමකට පිරිකරක් යවා ගඩොල අස්කර තමාගේම ගඩොලක් තැබීමට කටයුතු කළේ එම නිසාය.

දානය සැලසුම් කර සංවිධානය කරන අයටත් අමතර කුසලයක් ලැබේ. ඒ සංවිධානයේදී කය වචනය හා සිත යන තුන් දොරින්ම කුසල් සිදුවන නිසාය. දානය ගැන සිත සිතා සැලසුම් කිරීම විශාල පිනක් වේ. දානය පිළියෙළ කිරීම, දානය බෙදීම ආදී අවස්ථාවලදී මුඤ්චන චේතනානිසා අමතර කුසල් ඇතිවීමට හේතුකාරක

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

ගේ. දානය දීමෙන් පසුව ඒ ගැන පසුතැවිලි නොවී කුසලය ගැනම සිතීමෙන් තව තවත් කුසල් සිදුවේ. එහෙත් වියදම ගැන ශෝක වූවහොත්, පසුතැවිලි වුවහොත් අකුසල් සිදුවේ. මේ අනුව එකම දානමය පුණ්‍ය කර්මයකට සහභාගි වන පුද්ගලයින්ගේ තුන් දොරින් සිදුවන ක්‍රියාදාමය එකිනෙකට වෙනස් බැවින් ඔවුන් එකිනෙකාට ලැබෙන ඵල හා ආනිශංස ප්‍රමාණයද එකිනෙකට වෙනස් වේ.

යම් කිසිවෙක් යම් කුසල කර්මයක් සිදුකරන විට එහි විපාක ඇති වන්නේ එම පුද්ගලයාට ඇතිවන කුසල් සිත් අනුවය. කාමාචාර පුද්ගලයින් වූ අපට ඇතිවන කුසල් සිත් ප්‍රමාණය 8 කි. මෙම කුසල් සිත් 8 ඇතිවන්නේ දාන, සීල, භාවනා, අපචායන, වෙය්‍යාවච්ච, පත්තිදාන, පත්තානුමෝදනා, ධම්ම සවන, ධම්ම දේශනා සහ දිට්ඨිජ්ජුකම්මය යන දස පුණ්‍ය ක්‍රියාවන්ට අනුවය. මෙම කුසල් සිත් 8 එම කුසලය කරනු ලබන්නේ සිතේ ඇතිවන සතුටකින්ද, (සෝමනස්ස සහගත) නැතහොත් උපේක්ෂා සහගතවද යන කාරණය උඩ 4 බැගින් යුත් කොටස් දෙකකට බෙදේ. මෙම කොටසක්ද කුසලයේ ආනිශංස දන්නේ නම් ඥාන සම්ප්‍රයුක්ත ලෙසද, ආනිශංස ඵල විපාක නොදන්නේ නම් ඥාන විප්‍රයුක්ත යනුවෙන් නැවත කොටස් දෙකකට බෙදේ. ඒ එක කොටසක්ද තමාගේ කැමැත්තෙන්ම හෝ අනුන්ගේ බලපෑමකින් තොරව කරන්නේ නම් අසංකාරක ලෙස, වෙන කෙනකුගේ ඉල්ලීම හෝ බලකිරීමක් මත සිදුකරන්නේ නම් සසංකාරී ලෙසද යනුවෙන් කොටස් දෙකකට බෙදේ. මේ අනුව කුසල් සිත් 8 දස කුසලය සඳහාම ඇතිවන බැවින් සිත් සංඛ්‍යාව 80 කි. මෙසේ විවිධ අයුරින් හටගන්නා කුසල් සිත්වල ප්‍රබල දුබල භාවය ඒ ඒ සිත් සෑදීමට හේතුවන්නා වූ චෛතසික.චෛතසික හෙවත් සිතිවිලි අනුව වෙනස් වේ. මෙවැනි චෛතසික 52 ක් ඇති අතර කුසල් සිත් සඳහාම උපයෝගී වන්නා වූ චෛතසික 24 කි. ඒවා ශෝභන චෛතසික ලෙස හැඳින්වේ. මේ 24 ම සෑම කුසල් සිතක් සඳහාම උපයෝගී නොවන අතර ඒ ඒ ප්‍රමාණයන් මත ගුණාත්මක භාවය අනුව කුසල් සිතේ ප්‍රබලත්වය රඳා පවතී. එම නිසා එකම පුණ්‍ය කර්මයට සහභාගි වන එක් පුද්ගලයාගේ කුසල් සිත්වල ප්‍රබලත්‍යාව එකිනෙක හාත්පසින්ම වෙනස් නිසා ඵල විපාක හා ආනිශංස එකිනෙකට වෙනස් වීමට මෙයද හේතුකාරක වේ.

ප්‍රඥාව යනු යම් ධර්මයක ස්වරූපය අවබෝධ කර ගන්නා නුවණයි. ප්‍රඥාව අමෝහය සහ ඥානය යනු මෙයට සමාන අර්ථයන් සේ දැක්විය හැක. මෙය කුසල් සිත් ඇති කිරීමට සිතට උදව් වන චෛතසිකයකි. ප්‍රඥාවන්තයාට ප්‍රබල කුසල් ලැබෙනුයේ ඔවුන්ගේ අමෝහය සහ ඥාන සම්ප්‍රයුක්ත භාවය නිසාය. කුසලයන් උත්පාදනය වනුයේ කුසල මූලයන් 3 ක් මූලික කරගෙනය. එනම් ආලෝකය අද්වේශය හා අමෝහයයි. යම්කිසි අරමුණක් ගන්නා විට එම අරමුණ තත්ත්වාකාරයෙන් දැන ගැනීමට නොපිළිවන් වන අයුරින් සිත අපැහැදිලි කරන අඳුරු කරන ස්වභාවයට මෝහය යයි කියනු ලැබේ. මෙකී ප්‍රතිවිරුද්ධ අරමුණ පැහැදිලි කර යථාවබෝධයෙන් අරමුණකර යොමුකර සිත පිරිසිදු කර ඒකාලෝක කර සිත පහන් කරන තත්ත්වය අමෝහයයි. එමනිසා අමෝහය හෙවත් ප්‍රඥාවෙන් ඇතිකර ගන්නා සිත් ප්‍රබලය. ඒවා සෑමවිටම අසංකාරිය. අසංකාරී කුසල් සිත් සසංකාරී කුසල් සිත්වලට වඩා ප්‍රබලය. එසේම අමෝහයෙන් යුක්ත තැනැත්තාගේ ප්‍රඥාවන්ත භාවය නිසා ඔවුන්ගේ ඥාන සම්ප්‍රයුක්තයෙන් යුක්තය. ඥාන සම්ප්‍රයුක්ත කුසල්ද, ඥානවිප්‍රයුක්ත කුසල්වලට වඩා ප්‍රබල බැවින් ප්‍රඥාවන්තයාකරන කුසල්වල ඵල විපාක හා ආනිශංස වැඩිය. ඒ අනුව එකම පුණ්‍ය කර්මය කරන පුද්ගලයන්ගෙන් ප්‍රඥාවන්තයාට ලැබෙන කුසලය ප්‍රබල වේ.

එකම පුණ්‍ය කර්මය වුවද කැප කිරීම වැඩි පුද්ගලයාට වැඩි වළ විපාක ලැබීමට හේතුවේ. උදාහරණයක් ලෙස මල් පූජා කිරීම ගනිමු. මල් පූජා කිරීමෙන් මහා ආනිශංස ලැබෙන බව බුදු දහමේ සඳහන් සුමන මාලාකාරයාගේ කතාවෙන් පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වසන සමයේ දිනක් භික්ෂූන් වහන්සේලා පිරිවරා ගෙන පිඬුසිඟා වඩිමින් සිටි සේක. එකල බිම්බිසාර රජතුමාට මල් සපයන සුමන නම් මාලාකාරයා රජතුමාවෙත මල් ගෙන යන අතරමගදී පිඬුසිඟා වඩින බුදුරජාණන් වහන්සේ දැක සිත පිනා ගොස් බුදුන්ට පිදීමට දෙයක් නොමැතිව රජතුමා දෙන දඬුවමක් දුන්නාවේ යයි සිතා රජතුමාගේ මල්වලින් මිටක් බුදුන්ට පිදීය. එම මල් බුදුරජාණන් වහන්සේ වටා වියනක් මෙන් පිහිටියේය. මෙම ආශ්චර්යයෙන් පුදුමයට පත් සුමන ඉතිරි මල් ටිකද බුදුන්ට පූජා කළේය. පෙර මෙන්ම ඒ මල් සියල්ලම බුදුන් වටා වියනක් මෙන් පිහිටියේය. මෙම ආශ්චර්යය දුටු ජනයා සාදු නද දෙමින් ඝෝෂා කරන්නට වූහ. එම පුවත දැනගත් බිම්බිසාර රජතුමාද එම ස්ථානයට පැමිණ එම ආශ්චර්යය දැක ප්‍රීතියට පත්ව සුමන මාලාකාරයාට දඬුවම් කරනු වෙනුවට ඇතුන් අට දෙනෙක්ද, අශ්වයින් අට දෙනෙක්ද, දාසයින් අට දෙනෙක්ද, දාසියන් අට දෙනෙක්ද, මහාර්ඝ පළඳනා අටක්ද, කහවණු අට දහසක්ද, ඉතා රූමත් කාන්තාවන් අට දෙනෙක්ද, යනුවෙන් ස්වර්ෂථක පරිත්‍යාග කළේය. මෙය දුටු ආනන්ද හාමුදුරුවන් බුදුරජාණන් වහන්සේ අමතා සුමන මාලාකාරයාගේ මෙම ක්‍රියාවේ විපාක විමසීය. එවිට



උන්වහන්සේ බුදුරජුන් මලින් පිදීම මහා පුණ්‍ය කර්මයක් බවත් එහි විපාක වශයෙන් සුමන මාලාකාරයා කල්ප ලක්ෂයක් කිසිදු දුර්ගතියකට පත් නොවී සුගතියේ ඉපදී සැප සම්පත් විඳ අවසානයේ සුමන නම් පසේබුදු වන බවත් වදාළ සේක. එවන් මහා ආනිශංස ලැබෙන මල් පූජා කිරීමේදී තම ගෙවත්තේම හදන මල් නෙළාගෙන ගොස් බුදුහාමුදුරුවන්ට පූජා කිරීම මල් කඩෙන් මල් මිලදී ගෙන ගොස් හෝ වෙනත් කෙනෙකුගෙන් ඉල්ලා ගත් මල් පූජා කිරීමට වඩා වැඩි පිනක් ලැබේ.


මල් කඩයකින් ගන්නා කෙනෙකුට හෝ අනුන්ගෙන් මල් ඉල්ලාගෙන පූජා කරන කෙනෙකුට මෙම අමතර කුසල කර්ම නොලැබේ. මල් පූජා කිරීම එකම පුණ්‍ය කර්මය වුවද ඵල විපාක ආනිශංස එකම නොවන්නේ පුණ්‍ය කර්මයට කරන මේ කැපකිරීම මතය.

මේ අනුව පුණ්‍ය කර්මයක් කිරීමේදී එහි ඵල හා ආනිශංස පුණ්‍යකර්මය කරන පුද්ගලයාගේ ප්‍රඥාව ඇතිවන කුසල් සිත් ප්‍රමාණය, සිත්වල ප්‍රබලත්වය කුසලය කිරීමට දරන වීර්යය කැපකිරීම ආදී කරුණු රාශියක් මත රඳා පවතින බව පෙනේ.

**වෛද්‍ය ප්‍රියන්ත හේවගේ**

''සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''

# දම්පල් කථික තරගයට ආරාධනා



**ශ්‍රීමත්** අනගාරික ධර්මපාලතුමන්ගේ 151 වෙනි ජන්මෝත්සවය නිමිත්තෙන් මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතියේ මෙහෙයවීමෙන් මහනුවර දම්පල් පාසල් ශිෂ්‍යයින් අතර ධර්මපල කථික තරගයක් ඔක්තෝබර් 4 වැනි දින උදේ 9 ට පුෂ්පදාන සමිති ශාලාවේදී පැවැත්වේ. ශ්‍රීමත් ධර්මපාලතුමාගේ ආගමික, ජාතික, සමාජ ශාසනික සේවාවන් හා ධර්මපාලතුමා දඹදිව බුදුදහම ව්‍යාප්ත කිරීම සේවාවන් අළලා විනාඩි පහකට සීමාවන ලෙස සිය කතාව පැවැත්වීම තේමාව වන අතර එක දහම් පාසලකින්.ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙදෙනකු මෙම තරගයට ඉදිරිපත් කරන ලෙස පුෂ්පදාන සමිතියේ ලේකම් ගිල්බට් අබේසේකර, සමිතියේ අධ්‍යාපන පුස්තකාල සේවා තරග කටයුතු අනුකම්වු ලේකම් සූරියකුමාර් හිටිහාමු යන මහත්වරු විසින් දහම් පාසල් ප්‍රධානීන්ට ලිපියක් මගින්ද දැනුම් දී ඇත.

# පාංශකූල සිවුරක් සැකසීමට සුදුසු වස්ත්‍ර

1. සෝසානික - අමු සොහොනෙහි දමූ වස්ත්‍රය
2. පාපණිකය - මග දෙපස වැටී ඇති වස්ත්‍ර
3. රථිය චෝලය - පින් කැමැති අය දෙන වස්ත්‍ර
4. සංසාර චෝලය - කසළ ගොඩ දමූ වස්ත්‍රය
5. සොත්ථිය - ස්ත්‍රීන්ගේ ගැබ් මල පිස දමූ වස්ත්‍රය
6. තනාන චෝලය - යකැදුරන් විසින් හැර දමූ වස්ත්‍රය
7. තිත්ථ චෝලය - නහනකොට හැර දමූ වස්ත්‍රය
8. හත පච්චාහතය - සොහොනට ගිය මිනිසුන් හැර දමූ වස්ත්‍රය
9. අග්නි දට්ඨිය - ගින්නට පිළිස්සුණු වස්ත්‍රය
10. ගෝඛායිනය - හරකුන් කෑ වස්ත්‍රය
11. උපචිකාඛායිහක - වේයන් කෑ වස්ත්‍රය
12. උන්දුරඛායිහක - මීයන් කෑ වස්ත්‍රය
13. අන්තච්ජින්නය - අග ඉරී ගිය වස්ත්‍රය
14. දයාච්ඡින්නය - දාවලු ඉරී ගිය වස්ත්‍රය
15. ධජාහටය - කොඩි සඳහා භාවිත කළ වස්ත්‍රය
16. ථූප චීවරය - තුඹස්වල බලි කර්ම පිණිස බැඳි වස්ත්‍රය
17. සමන චීවරය - භික්ෂූන් සතු වස්ත්‍රය
18. ආභිසේකිකය - රජුන් අභිෂේක කළ ස්ථානවල දමාගිය වස්ත්‍රය
19. පන්ථිකය - අතරමග වැටී ඇති වස්ත්‍රය
20. වාතාහටය - සුළඟට ගසාගෙන ගිය වස්ත්‍රය
21. සාමුද්දිය - මුහුදෙහි ගසාගෙන ගිය වස්ත්‍රය

# මිනිසා හඳුනා ගන්නේ කොහොමද?

මහාචාර්ය උතුරාවල ධම්මරතන හිමියන්ගෙන් අහමු

❐ කොහොමද අපෙ හාමුදුරුවනේ මනුෂ්‍යයා හඳුනා ගන්නේ?

මනුෂ්‍යයා හඳුනා ගැනීම ඉතාම අමාරු කටයුත්තක්. බුදුහාමුදුරුවෝ දේශනා කළ විදියට මනුෂ්‍යයා හඳුනා ගැනීමට සෑහෙන කාලයක් අවශ්‍ය වෙනවා. ආශ්‍රය කිරීමෙන් තමයි මනුෂ්‍යයකු හඳුනා ගන්න පුළුවන් වෙන්නේ. බුදුහාමුදුරුවෝ දේශනා කළා චරිත හා චරිත ලක්ෂණ අනුව මිනිසාව හඳුනා ගන්නා ක්‍රමය. බුද්ධ දේශනාවට අනුව මේ ලෝකයේ ජීවත් වෙන සියලුම මිනිසුන් චරිත ලක්ෂණ අනුව කොටස් 6 කට බෙදා දක්වන්න පුළුවන්. ඒ චරිත හය චරිත ලක්ෂණත් එක්ක මෙලෙස දක්වන්න පුළුවන්.

**1. රාග චරිතය**

ගමන් කරන විට අනුන් පහදන විලාශයෙන් යයි. හෙමින් සමව පා තබයි. රෙදිපිළි ආදිය හා නිදන ඇඳ පිළිවෙළට තියාග නියි. මිහිරි ආහාරවලට කැමැති වෙයි. ලස්සන රූප දෙස නිතර බලයි.

**2. ද්වේශ චරිතය**

පොළොව හාරන්නෙක් මෙන් පා තබයි. ඉක්මන් ගමන් ඇත. නිතර නිතර කිපෙයි. රළු, තද, ඇඹුල් ආහාර ප්‍රිය කරයි. ගුණවතුන්ට නින්දා කරයි. අනුන්ගේ දියුණුව නොඉවසයි. දනට පිනට නොදෙයි.

**3. මෝහ චරිතය**

එහෙට මෙහෙට පැද්දෙමින් යයි. අත් පා විසිරුවාගෙන නිදයි. කරන කියන වැඩ කටයුතු සියල්ලම පාහේ අපිළිවෙළයි. විචාර බවින් තොරයි. උඩඟු බව, සැකය, වැරදි අදහස් අත් නොහැරීම ආදී ලක්ෂණයි.

**4. ශ්‍රද්ධා චරිතය**

පරිත්‍යාගශීලීයි. ආගමානුකූල දිවි පෙවෙතක් ගෙවයි. පැහැදිය යුතු තැන පහදයි. කළකිරීම් රහිත වෙයි.

**5. බුද්ධ චරිතය**

විචක්ෂණ බුද්ධියෙන් යුක්තය. කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කරයි. නොබසුබස්නා උත්සාහයෙන් යුක්තය.




**6. චිත්ත චරිතය**

කතා කිරීමට දක්ෂය. කුසල් දහමින් නොඇලේ. අන්‍යයන් කී දෙය එලෙසම පිළිනොගනී.

මිනිසුන් තුළ තියෙන මේ ලක්ෂණ මුලින්ම දැනගෙන ඒ ඒ චරිතවලට ගැළපෙන අභ්‍යාස දෙන්න ඕනෑ.

❐ **චිත්තාභ්‍යාසවල යෙදෙන්නේ කොහොමද හාමුදුරුවනේ?**

චිත්ත අභ්‍යාසය දෙන්නේ මනසටයි. ඒකට ක්‍රම කීපයක් තියෙනවා. මේකට අපි භාවනාව කියලා කියනවා. භාවනාව අපිට කොටස් දෙකකට බෙදන්න පුළුවන්.

**1. සමථ**

**2. විදර්ශනා කියලා.**

සමථ භාවනාවෙන් අපි කරන්නේ සිත දියුණු කිරීමයි. විදර්ශනා භාවනාවෙන් කරන්නේ ලෝකය පිළිබඳව යථාර්ථය දැකීමයි. මේ භාවනා බෞද්ධ, අබෞද්ධ, ජාති, ආගම් භේදයක් නැතිව හැමදෙනාටම කරන්න පුළුවන්. ඒකයි විශේෂත්වය. චිත්ත අභ්‍යාසවල පළවෙනි එක තමයි මෛත්‍රී භාවනාව. මෛත්‍රී භාවනාව චිත්තාභ්‍යාසයක් විදියට වඩන්නේ මෙහෙමයි. උදෙන්ම නැගිටලා පිරිසිදු, පිහිටි පොළොවේ සෙරෙප්පු නොදමා හිටගෙන හොඳ හුස්මක් උඩට අරගෙන ඒක පහළට දාලා ඇස් පියාගෙන මේ විදියට මෙනෙහි කරන්න ඕනෑ.

- අහං අවේරෝ - මම වෛර නැත්තෙක් වෙම්වා.
- අහං අව්‍යාපජ්ජෝ හෙමි - මම ක්‍රෝධ නැත්තෙක් වෙම්වා.
- අහං අනීඝෝහෝමි - මම උපද්‍රව නැත්තෙක් වෙම්වා.
- අහං සුඛී අත්තානං පරිහරාමි - මම සුව ඇත්තෙක් වෙම්වා.

මේ විදියට හැමදාම උදේට විනාඩි 10 ක් විතර කරන්න ඕනෑ. මේක තමයි මුල් පියවර. මේ පියවර හොඳට පුරුදු වුණාම ඊළඟ පියවරවල්වලට යන්න පුළුවන්.

❐ **මෙම අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මොනවද හාමුදුරුවනේ?**

බොහොම හොඳ ප්‍රශ්නයක්. අපි ඕනෑම දෙයක් කරන්නේ ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන්. චිත්ත අභ්‍යාස කිරීමෙන් අපිට හොඳ ප්‍රතිඵල ලබන්න පුළුවන්. ප්‍රධාන වශයෙන් මිනිසුන්ට හැදෙන ලෙඩ රෝග දෙකක් තියෙනවා.

**1. කායික රෝග**

**2. මානසික රෝග**

කියලා. අපේ මනස ලෙඩ වුණාම ඊට සාපේක්ෂව බොහෝ අවස්ථාවල කයක් ලෙඩ වෙනවා. මෙතනදී විශේෂයෙන් සඳහන් කරන්න ඕන කායික රෝගවලට බෙහෙත් දීලා ඉක්මනින් හොඳ කරගන්න පුළුවන්. ඒ වුණත් මානසික රෝගවලට ප්‍රතිකාර කරන එක හරි අමාරු දෙයක්. අපි මෙතනදී කරන්නේ ප්‍රධාන වශයෙන් මානසික රෝග හට ගැනීමට ප්‍රථම ඕනෑම පීඩනයක් විඳ දරා ගැනීමට මනස ශක්තිමත් කිරීමයි. ඒ වගේම තමයි මනස සන්සුන් කිරීමත් ඉතාමත් වැදගත් වෙනවා.

මානසික ව්‍යාකූලතාව, මානසික පීඩනය, ඉක්මනින් කේන්ති යෑම, නින්ද නොයෑම, හිත එක අරමුණක තියාගෙන වැඩ කරන්න බැරිව ආරවුල් ඇතිකර ගැනීම, හැම වෙලාවෙම බයවෙලා වගේ ඉන්න එක, නින්දෙන් ඇවිදීම, මතක ශක්තිය දුර්වල වීම, මනසේ නිතරම කැළඹිලි ස්වභාවය, මේවා හැම දෙනාටම වගේ තියෙන මානසික ප්‍රශ්න. මේවාට බොන බෙහෙත් පෙත්තෙන්ම හොඳ කරන්න බැහැ. ඒ විතරක් නෙවේ, අධි රුධිර පීඩනය (ප්‍රෙෂර්) හිතට විඳ දරා ගන්න බැරි තරහවක් ඇති වුණාම ප්‍රෙෂර් එක වැඩි වෙනවා. ඒක අපි හැමදෙනාම දන්නවා. මෙන්න මේ වගේ ලෙඩ රෝගවලට පිළියම් භෞතික බෙහෙත්වලින් පිළියම් කරන්න අමාරුයි. මේ වගේ රෝගවලට තියෙන හොඳම පිළියම තමයි චිත්තාභ්‍යාසය. මෙවැනි රෝගවලට චිත්තාභ්‍යාසය තුළින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන නිසා තමයි අද දහස් ගණන් ජාති භේදයක් නැතුව සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන් අප හොයාගෙන එන්නේ.

1. **සයිකෝෂියා** - මිනිස් මොළයේ ස්නායු පද්ධතියේ ඇතිවන මානසික ආබාධ. උන්මත්තක භාවය.

2. **නිව්රෝසියා** - මානසික අපහසුතා එතරම්ම දරුණු ලෙස නොපෙනුණත් මෙවැනි රෝගීන් ඉන්නවා. මානසික පීඩනය, අසහනය, කාංසා රෝග, සන්නි රෝග, මායා රෝග, භීතිකා රෝග.

මනෝ වෛද්‍ය ඊ. කේ. රොද්‍රිගෝ මහතා කියන්නේ ලංකාවේ 27 ලක්ෂයක් මානසික රෝගීන් බවයි. අපි මුලදී කතා කෙරූ හැම මානසික රෝගයකටම මෙම චිත්තාභ්‍යාස කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ගන්න පුළුවන්.

**ධර්ම ගවේෂක**

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''



සිතන්නට යමක්

# පමණට වඩා ආහාර ගැනීමත් වැරදියි

පසේනදී කොසොල් රජතුමා අසීමිත ලෙස ආහාර අනුභව කරන්නෙකි. බත් මතය ඇතිවන තුරු ගනියි. දිනක් එතුමා ආහාර අනුභව කළේය. එවේලේම බුදුන් වහන්සේ දකින්න ගියේය. සිරිපා නමස්කාර කළේය. එකත්පස් විය. එහෙත් රජතුමාට එක ලෙස සිටීමට බැරිය. බත් මත ඇතිවිය. නිදිමත ආවේය. ක්ලාන්ත ස්වරූපයෙන්ය. එහා මෙහා පෙරළෙයි. බුදුන්ගේ වදන් නොපිළිගන්නා සේය. උන්වහන්සේ මෙසේ ඇසූ සේක.

"ඇයි මහරජතුමනි! විවේක නොගෙනද ආවෙ?"

"එසේය ස්වාමීනි! මට ආහාර ගත් පසු මෙසේ සිදුවෙයි."

"මහරජ, අප්‍රමාණ ආහාර ගැනීම දුකක්. එය පමණ දැන ගත යුතුය. එවිට දුකක් ඇති නොවේ. ඇතිවන්නේ සුවයකි."

කොසොල් රජතුමා නිහඬය.

බුදුන් වහන්සේ එය තවදුරටත් පහදා දෙමින් "මහරජතුමනි, සිහි ඇති මිනිසා ලද භෝජනය කොතරම් මිහිරි වුවත් ගන්නේ පමණට පමණි. එසේ නැතිව කෑදරකමට අපමණ ගත් විට සිරුරට වේදනා ඇති කරයි. ඉන් ආයුෂද සීමා වෙයි" පවසමින් ආහාර පමණට ගැනීම ගැන ගාථාවක්ද පැවැසූ සේක.

එය ඉගෙන ගැනීමටවත් රජතුමාට බැරි විණි. ඒ තරමට බත් මතින් සිටියේය.

බුදුන් වහන්සේට ඒ බව වැටහුණු සේක.

රජතුමා පැමිණ සිටියේ සිය බෑණා සමගය. ඔහු සුදස්සන නම් විය.

බුදුන් වහන්සේ ඔහු අමතා "ඔබ මේ ගාථාව ඉගෙන ගන්න."

"ස්වාමීනි, මම එය ඉගෙන ගෙන කුමක් කරම්ද?"

"රජතුමා තරමක් ආහාර ගන්නා විට මේ ගාථාව කියන්න. එවිට ආහාර ගැනීම නතර කරයි."

"හොඳමයි ස්වාමීනි."

පසුව ඔවුහු විහාරයෙන් නික්ම ගියහ. එතැන් පටන් රජතුමා ආහාර අනුභව කරන විට සුදස්සන ගාථාව කීවේය. රජතුමා ආහාර ගැනීම නැවැත්විය. බත්මත නැතිවිය. ඒ ගත් ප්‍රමාණය පමණක් පසුදින සපයන්න විය. කලක් ගෙවිණ. රජතුමා කෙසඟ විය. සුවපත් විය.

යළිත් කොසොල් රජතුමා බුදුන් දැක්මට ගියේය. නමස්කාර කොට එකත්පස් විය.

"රජතුමනි, දැන් කොහොමද? තවත් බත් මත ඇති වෙනවාද?"

"නැත ස්වාමීනි, මම සුවපත්ව සිටිමි. දැන් මට මුවකු හෝ අසකු හෝ ලුහුබැඳ අල්ලා ගැනීමට හැකිය."

"බොහොම හොඳයි."

"එපමණක් නොවේ ස්වාමීනි, මගේ ජීවිතයේ තිබූ බොහෝ දේ වෙනස් කර ගතිමි."

"ඒ කුමක්ද?"

"මගේ සහෝදරියගේ පුතා සමග තිබූ අමනාපකම අත් හැරියෙමි. ඔහුට මගේ දුව වජිරා සරණ පාවා දුන්නෙමි. ඔවුන් වෙසෙන පළාත දැවැද්දට දුන්නෙමි."

"මහරජතුමනි! බොහොම හොඳයි. එපමණක් නොවේ. නිරෝගිකම උතුම් ලාභයකි. ලද දෙයින් සතුටට පත්වීම තරම් ධනයක් නැත. විශ්වාසවන්ත තරම් ඥාතියෙක් නැත. නිවන තරම් සුවයක්ද නැත යනුවෙන් පවසා ධර්ම දේශනාවක්ද පැවැත්වූ සේක.

( ධම්ම පදට්ඨ කතා ඇසුරිනි. )


**හලලියේ කරුණාතිලක**



"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

# ඊර්ෂ්‍යාවෙන් පුපුරනවාද
# රාග ගින්නෙන් දැවෙනවාද
# මෝහයෙන් අන්ධ වෙලාද?

# හදවතට තට්ටු කර බලන්න



''ඉස්සන් මරාපිය
රා කළයක් බීපිය
මෝව අඹවාපිය
මෙතුන කරලා මාව කාපිය''
(දහම් ගැට මාලාව)

වත්මන් සමාජය වූකලී විවිධය. විෂමය. භින්න රුචිකය. එවන් සමාජයක් තුළ මිනිස් සිතැඟි මස්තකප්‍රාප්ත කරගැනීම වූකලී අතිශයින්ම දුර්ලභ කාරණයකි. එබැවින් මිනිස් සිත් තුළින් අයින් විය යුත්තේ නුගුණයන්ය. ''බුදු බණ අසන්නට ඇති අපි නිරන්තරේ - ගතිගුණ අතින් අපි තවමත් වනන්තරේ'' යන ගී කාණ්ඩයට අනුව අප අපගේ ජීවිත කාලය තුළදී කොපමණ බණ අසා ඇත්ද? කොපමණ දන් දුන්නද, කොපමණ බණ ඇහුවද, දන් දුන්නද අප සිත් තුළ ගුණධර්ම නොමැති නම් කිසිවිටක අපට දියුණුව කරා ගමන් කළ නොහැකිය. එබැවින් අද අපට අවශ්‍ය විය යුත්තේ බණ දහම්වලට වඩා ගුණදහම්ය. ලෝවැඩ සඟරාවේදී වීදගම නාහිමියෝ මෙසේ පැවැසූහ.

''අත්වැඩ, පරවැඩ සමව සිතන්නේ
මෙත් සිත සව්සක කෙරෙහි කරන්නේ''

වශයෙනි. එහෙත් අද බැලූ බැලූ තැන අත්වැඩ මිසක පරවැඩ දක්නට නොමැත. ඒ මන්දයත් යමෙක් වරදක් කළහොත් ඔහුට බැණ වදින්නේද පර වැඩ කරන්න එපා කියාය. නැත අප සැබැවින්ම කළ යුතු වන්නේ පරවැඩය. එබැවින් අප අන්‍යයන් ගැන සිතිය යුතුය. අප රටේ ජීවත් වන සමහර මිනිස්සු තම නිවෙස්වල ඇති යම් යම් අපද්‍රව්‍ය අන්‍යයන් ගැන නොසිතා මහමගට දැමීමට පුරුදු වී ඇත. සෑම මොහොතකම සිතනුයේ තමා පිරිසිදු වීමට විනා අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට නොවේ. එබැවින් මනුෂ්‍යයන්ගේ සිත් තුළින් ඉවත් විය යුත්තේ ඊර්ෂ්‍යාවයි. තවකෙක් තවෙකෙකුගේ සම්පත් ධනධාන්‍ය ආදිය විනාශ කිරීමට කටයුතු කරයි. එහෙත් කිසිවෙක් තුළ කිසිම උත්සාහයක් නොපෙන්වයි. සමහරෙක් තමන්ට ප්‍රයෝජනයක් නැති දෑ වෙන කෙනකුට දීමට මැලිවේ. තම වස්තුව සඟවාගෙන තබා කිසිවෙකුටත් නොපෙන්වා ඒ ඔක්කොම සිතා වැළපී දුක් විඳ මරණයට පත්වී ප්‍රේත භවයක් ලබා දුක් විඳී. එබැවින් අප ඊර්ෂ්‍යාව මරා දැමිය යුතුය. **ඉස්සන් මරාපිය** වශයෙන් දක්වා ඇත්තේ මේ කාරණයයි. ආයුර්වේදයේ සඳහන් අෂ්ටාංග හෘදය නම් ග්‍රන්ථයේ සඳහන් වන්නේ හේන ඊර්ෂ්‍යෝත් එළෙන්තු ඉගැන්වීමය. අප ඊර්ෂ්‍යා කළයුත්තේ ඵලයට නොව හේතුවටය. සැබැවින්ම බොහෝ අය අන්‍යයන්ගේ වස්තුවට ඊර්ෂ්‍යා කෙරේ. නිදසුනක් ලෙස යමෙක් මෝටර් රථයක් ගතහොත් අප ඊර්ෂ්‍යා කරන්නේ ඔහුගේ මෝටර් රථයට. අප කොපමණ මෝටර් රථයට ඊර්ෂ්‍යා කළත් අපට මෝටර් රථයක් ගැනීමට නොහැකි වනු ඇත. එබැවින් අප ඊර්ෂ්‍යා කළ යුත්තේ ඵලයට නොව හේතුවටය. එම මෝටර් රථය ගැනීම සඳහා ඔහු කොපමණ මුදල් ඉතිරි කළාද, කොපමණ නිදි මැරුවාද, කොපමණ වැඩ කළාද යන්නය. සැබැවින්ම අපද ඒ හා සමාන උත්සාහ කළහොත් නොබෝ දිනකින් අපටද මෝටර් රථයක් ගත හැකිවනු ඇත. එබැවින් අප තුළ ඊර්ෂ්‍යාව තිබිය යුත්තේ හේතුවටය. කවදවත් ගෙදරට, මුදලට, යානවාහනවලට ඊර්ෂ්‍යා කොට ඒවා ලබාගත නොහැක. මෙහිදී ඊසොප් නම් කතාකරුවාගේ උපමා කතාවක් මෙසේ දැක්විය හැක. දිනක් ගෙඹි දෙනක් තම පිරිවර පැටවුන් සමග සිටින විට ඒ අසලින් එළදෙනෙක්ද තම පැටවුන් සමග සිටී. මෙහිදී ගෙඹි දෙනගේ පැටව් පැවැසුවේ බලන්න අර එළදෙනගේ ලොකු, අපේ අම්මා හරිම පොඩි යැයි ගෙඹි පැටවුන් පැවැසීය. මෙය ඇසූ ගෙඹි දෙනගේ සිතට මහත් ඊර්ෂ්‍යාවක් ඇති වන්නට විය. මෙහිදී ගෙඹි දෙන තම කට වැසීය. ටික ටික එළදෙනගේ ප්‍රමාණය වන තෙක් ඇඟ පිම්බෙන විට ගෙඹිදෙන පැලී මරණයට පත්විය. සැබැවින්ම ඊර්ෂ්‍යාව නිසා අපද ඕනෑවට වැඩිය පිම්බිය නොයුතුය. මක්නිසාද යත් ගෙඹි දෙනට වූ විපත අපටද විය හැකි හෙයිනි. එබැවින් අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා නොකර තමන් උත්සාහ කළ යුතුය. එමගින් ඔබේ ජීවිතය යම් පරිවර්තනයකට ලක්කර ගැනීමට හැකිවනු ඇත. තවද අප හිත් දූෂිත වීමට ප්‍රධාන හේතුව රාගයයි. රාගය යනු කාමයයි. එයටම තවත් නම් වශයෙන් දැක්විය හැක්කේ ලෝභය, ආසාව, ඇල්ම ආදී වශයෙන් දැක්විය හැක. මෙම වචනයන්හි යම් යම් වෙනස්කම් දක්නට හැකි වුවද සිදුවනුයේ මහත් හානියකි. එබැවින් **රා කළයක් බීපිය** යනුවෙන් දැක්වූයේ රා කළය නම් රාගයයි. සැබැවින්ම අප මෙකී රාගය බී අවසන් කිරීමට අවශ්‍ය නම් නැතහොත් බොහෝ දුක්ඛයන්ට මුහුණ දීමට සිදුවිය හැක. සැබැවින්ම මෙම ලෝභය වූ කලී බොහෝ දෙනා තම ජීවිතය විනාශය කරා පමුණුවා ගනී. එකම පවුලේ එකම සහෝදර සහෝදරියන් කුඩා කල එකට කා බී සෙල්ලම් කළද ඔවුන්ගේ කරදඬු උස්මහත් කල්හි ඔවුන්ගේ සමගිය බිඳී එකම නිවසේ ජීවත් වීමට පවා අපොහොසත් වනු ඇත. මෙසේ ක්‍රමක්‍රමයෙන් ඉඩම් හා වැටමායිම් බෙදා ගැනීමට අපොහොසත් වන ඔවුන් මහ පොළොව උදෙසා ඇණකොටා ගන්නා මට්ටමට පත්වනු ඇත. සැබැවින්ම වර්තමාන සමාජයේ ජීවත් වන මිනිසා දැඩි ලෝභියෙක් වීම තුළින් ඔහු ආත්මාර්ථකාමී පුද්ගලයෙක් බවට පත්වී හමාරය. එබැවින් බුදුසමය මගින් නිර්දේශිත නිර්ලෝභී වීම තුළින් පුද්ගලයාගේ මෙලොව පරලොව දෙලොවටම ජයග්‍රහණයට ඉවහල් වනු ඇත. එබැවින් අප රාගය හෙවත් දැඩි ලෝභය අත්හැරිය යුතුය. එසේම මිනිසුන් තමන් ගැන අවබෝධයක් නොමැති වීමෙන්ද, අනුන් ගැන අවබෝධයක් නොමැති වීමෙන්ද මෝහයෙන් වැසී ඇත. ''**මෝව අඹවා පිය**'' මෙසේ දක්වන ලද මෝහය විනාශ කළ යුතුය. තවද බුදුසමය මගින් ''**සබ්බේ සංඛාරා අනිච්චා**'' යන අනිත්‍ය සංකල්පය ඉදිරිපත් කොට ඇත්තේද වැරදි සහ අපරාධ අවම කරගැනීමේ අභිලාෂයෙනි. එසේම ''**සබ්බේ සත්තා මරිස්සන්ති**'' යන ඉගැන්වීම පාදක කොටගෙන ඇත්තේ මරණ ධර්මතාව කරණ කොටගෙනය. අපරාධ අවම කිරීමය.


**පූජ්‍ය දළුගම සමිතඥාන හිමි**

''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk





# එදා බණ අදට ගැළපේද?

එදා බණ පොත අදට නොගැළපෙන බවට ඇතැම්හු හරසුන් අඥාන තර්ක විතර්ක අද දවසේදී කොතෙකුත් ඉදිරිපත් කරති. කාම කෝපයෙන් ඇවිලුණු දුශ්චරිතවත් මිනිසුන්ට එවැනි නොගැළපීම් පෙනීම පිළිබඳව අප පුදුම විය යුතුද නැත. ඔවුන් එසේ නොගැළපෙන බව පවසන්නේ ඔවුන්ගේ එම දුශ්චරිතවත් ක්‍රියාවන්ට අවියක්ව ඇත්තේ බණ පොතේ එන දහම් කරුණු නිසාය. බුදුදහමේ දක්වෙන ලෝභ, දෝෂ, මෝහ, අලෝභ, අදෝෂ, අමෝහ යන කුසල මූල හා අකුසල මූල එදා මෙන්ම අදටද නොගැළපෙන බව හිතට එකඟව කාට කිව හැකිද? එබැවින් මෙවැනි සර්වකාලීන අගයකින් හෙබි චිරන්තන අපේ බණ පොත කිසිවෙක් කිසි දින හෙළා නොදකිනු ඇත.


බණ පොතේ අන්තර්ගතව ඇත්තේ සර්වඥතා ඥානයෙන් දේශනා කළ බුද්ධ දේශනාවන්ය. විශේෂයෙන් මනුෂ්‍යයන් උදෙසා දේශනා කළ එම දහම් කරුණු හැම කාලයකටම පොදුය. එනම්, එදා අද මෙන්ම හෙට දිනයේදීද ජීවත් වන්නේ මේ පංචස්කන්ධයෙන් නිර්මාණය වූ මනුෂ්‍යයාම බැවිනි. මේ නිසා මේ දහම එදා මෙන්ම අද දවසේත් ජීවත් වන මනුෂ්‍යයන්ටද එක සේ වලංගුය. මේ වලංගු භාවය අවලංගු කිරීමට කිසිවෙකුට නොහැකිය. මනුෂ්‍යයන් මෙලොව ජීවත් වන තාක් කල් මේ දහමේ සත්‍යවාදී බව රැඳී පවතිනු ඇත.

එමෙන්ම බණ පොතේ සඳහන් වන ඇතැම් සිද්ධීන් ඇතැම්හු අභව්‍ය සිද්ධීන් යයි ප්‍රකාශ කරති. ඊට හේතුව මෙම සංසිද්ධීන් ඔවුනට විෂය වී නොමැති බැවිනි. ආධ්‍යාත්මික දියුණුව අතින් පෝෂිත එදා දෑ අද සමාජයට විෂය නොවීම සැබැවින්ම යුක්ති යුක්තය. එහෙත් මේවා එදා සමාජයට අරුම පුදුම අභව්‍ය දේවල් නොවන්නට ඇත. නැතහොත් මේවා කට කහන නිසා දේශනා කළ දේශනා නොවේ.

බණ පොතේ සමහර දේවල් පරිසරය උපයුක්ත කරගනිමින් කාව්‍යමය භාෂාවකින් විස්තර කර තිබේ. සක් දෙවිඳුන් සඳේ හාවෙකු ඇන්ද බව පැවසීම එවැනි එක් අවස්ථාවකි. මෙය සක් දෙවිඳු පින්සලක් ගෙන හඳේ හාවෙකු ඇඳීමක් ගැන විවරණයක් නොවේ. එනම් පසළොස්වක සඳ දුටු කල්හි බෝධිසත්ව භාවා කළ එම සත්ක්‍රියාව අප හදවතේ නිරූපණය කිරීමට ගත් උත්සාහයක් පමණකි. ■



''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ



# සඳුන් ගසින් උපන් මෛත්‍රී බුදුන්

## චීනයට ගියොත් ඔබටත් දකින්නට පුළුවන්

චීනයේ බීජින් අගනගරය ආශ්‍රිතව බෞද්ධ විහාරාරාම සැලකිය යුතු ප්‍රමාණයක් පිහිටා තිබේ. ඒවා බොහෝවිට හඳුන්වනු ලබන්නේ ''ලාමා ආශ්‍රම'' නැතහොත් ලාමා පන්සල් වශයෙනි. ලාමාවරු බෞද්ධ භික්ෂූන් වහන්සේලාය. එහි ඇති විශාලම ලාමා පන්සල වන්නේ ''යොංග්ගොංග් ලාමා ටෙම්පල්'' (Yonghcgong Lama Temple) ආශ්‍රමයයි.

චීනයේ පැරණි රජ පෙළපතක් වූ Qian රාජ වංශයේ රජ කුමරකු වූ යොංග් විසින් 1694 දී පමණ මෙම ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ වාසස්ථානයක් වශයෙන් බව සඳහන්ය. එන්පසු ගොඩනැගිල්ලට නොයෙකුත් කොටස් එකතු කරමින් පන්සල් සංකීර්ණයක් නැතහොත් ලාමා ආශ්‍රමයක් බවට පත්කොට ඇත. රජුගේ ඇවෑමෙන් 1744 වර්ෂයේදී කිරුලට පත්වන ක්විං ලොංග් රජතුමා තම මාලිගය යොංග් ගොංග් ආශ්‍රම සංකීර්ණය වෙත ගෙන ගොස් ඇත.


යොංග් ගොංග් යනු බලකොටුවක ස්වරූපය ගත් රාජ මාලිගාවක් පමණක්ම නොවේ. එය මැන්ඩූරියන්, චීන, ටිබෙට්, මොංගෝලියන් ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලත් අලංකාර නිර්මාණයකි. මෙම විහාර සංකීර්ණය ශාලා රාශියකින් යුක්තය. එහි එක් ශාලාවක් වන්නේ වන්ෆු පැවිලියන් නමින් හැඳින්වෙන ඉතා උස් වහල සහිත ගොඩනැගිල්ලක්ය. මෙහි ඇති විශේෂත්වය නම් ශාලාව මධ්‍යයෙහි පිහිටා ඇති මීටර් 18 ක් පමණ උසින් යුත් මෛත්‍රීය බුදුරජාණන් වහන්සේගේ අලංකාර මූර්තියයි. එය නෙලා තිබෙන්නේ විශාල සුදු හඳුන් වෘක්ෂයකිනි. මෙහි පළවන ඡායාරූපවලින් දක්වෙන්නේ එම පිළිම වහන්සේය. මෙහි නිර්මාණකරුවා කවරෙක්ද යන්න පැහැදිලි නැතත් නිර්මාණය කොපමණ සුවිශේෂීද යත් 1990 වර්ෂයේදී මෙම සඳුන් මූර්තිය ගිනස් ලෝක වාර්තා පොතටද ඇතුළත් කර ඇත. ඒ සම්බන්ධ විස්තර සහිත පුවරුවක් ශාලා කුළුණක ඔබ්බවා පිහිටුවා ඇත.

මෛත්‍රී බුදුන් වහන්සේ සඳුන් දැව මූර්තිය පිහිටුවා තිබෙන ශාලාවේ ශාක්‍යමුණි හෙවත් ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජාතක කතා ඇතුළත් චිත්‍ර 41 බිත්තිවල සවිකර ඇත. අනිකුත් සෑම ශාලාවකම පාහේ නොයෙකුත් බුද්ධ ප්‍රතිමා වගේම Dian Long රජුට ත්‍යාග වශයෙන් ලැබුණා වූ ඉතාමත් වටිනා Tangka චිත්‍ර මූර්ති රාශියක් තැන්පත් කොට ඇත. එබැවින් යොන්ග් ගොන්ග් වනාහි ටිබෙට් බෞද්ධ සංස්කෘතියේ වටිනා පුරාවස්තු එක්රැස් කළ කලාගාරයක් වශයෙන්ද හැඳින්වීමට පුළුවන.

මෙම විහාර සංකීර්ණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලින් පසුව 1981 සිට මහජනයා සඳහා විවෘත කොට ඇත. වර්තමානයේදී යොංග් ගොංග් ආරාමයේ කටයුතු අංග දෙකකින් ක්‍රියාත්මක කෙරේ. එක් අංගයක් උදය කාලයේ සූත්‍ර සජ්ජායනා කිරීමේ කටයුතු සිදුකරන අතර අනෙක් අංශය ටිබෙට් සම්ප්‍රදායානුකූලව පූජා උත්සව විධි පවත්වාගෙන යනු ලබයි. දෛනිකව මෙම විහාර සංකීර්ණය වන්දනාමාන කිරීම සඳහාත්, දකබලා සිත් පහදා ගැනීම සඳහාත් දෙස් විදෙස් සංචාරකයෝ විශාල වශයෙන් පැමිණෙති.

**එස්. ආර්. එම්. ජයසේකර - මාවනැල්ල**

...ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)




පඬුපුල් අසුනින් බැස ගියේද

# සක් දෙවිඳුනි

දෙව්ලොව යනු සියලු යස ඉසුරින් පිරුණු භූමියකි. එහි රජු සක් දෙවිඳුය. එවන් තැනක රජ බව කොතරම් සැපවත් එකක්දැයි සිතීම අපහසුය. මෙහිදී එබඳු සැපවත් ජීවිතයකට හිමිකම් කියන සක් දෙවිඳුන් වීමට අවශ්‍ය කරන එක් අංගයක් නම් සදාචාරවත් බවයි. සක්‍ර බව ලැබීමට උපකාරී වන එම සදාචාරවත් අංග මොනවාදැයි මෙසේ එකිනෙක විමසා බලමු.

## 1. යහපත් වචන කතා කිරීම

යහපත් වචනවලට අපි සියල්ලෝම ප්‍රිය කරමු. ඒවා නිසා කියන්නාගේ හා අසන්නාගේ සිත් සැනහෙයි. පහන්වෙයි. සක් දෙවිඳු යහපත් වචනවලට ප්‍රිය කරන අයෙකි. දිනක් අසුරයන්ගේ රජු වන වේපචිත්ති හා සක් දෙවිඳු අතර වචනයෙන් වන සටනක් විය. එහිදී බාලයා මෙල්ල කිරීමට දඬුවම් කළ යුතු බව අසුරේන්ද්‍රයා කීවේය. ඒ වෙනුවට සක් දෙවිඳු බාලයා කිපුණු බව දන යමෙක් සිහි ඇතිව සන්සුන් වේද එය බාලයා මෙල්ල කිරීමේ ක්‍රමය යැයි කීවේය. මේ අනුව සක් දෙවිඳුන්ගේ යහපත් වදන නිසා දෙවියන් සතුටු වූහ. එහිදී සක් දෙවිඳු තවදුරටත් යහපත් වචන කීවේය. තමාට බාලයා මැඩ පවත්වන්න නොහැකි නිසා ඉවසීම අගේය. එහෙත් බාලයා මැඩ පවත්වන්න හැකියාව තිබියදී ඉවසීම වඩාත් අගනා බව කියමින් එම වාග් යුද්ධය දිනුවේය. ඔහු යහපත් වචන නිසා ජයගත්තේය. ඔහු රජකු ලෙස ආදරශමත් වචන භාවිත කළේය.

## 2. සතුන්ට හිංසා නොකිරීම

සක්‍ර ජීවිතයෙන් සත්ව හිංසාවක් සිදු නොවේ. අනුනට කිසිදු වරදක් සිදුනොවී ක්‍රියා කිරීමට වගබලා ගත්තේය. දිනක් සක් දෙවිඳු පසුපස අසුරයෝ ලුහු බැන්දෝය. සක්‍රයා යුද්ධ කළොත් ජීවිත හානි සිදුවන නිසා එයින් වැළකී පලා ගියේය. පලා යන ඔහුගේ රිය ගුරුළු කූඩුවල වැදෙන බව දුටු සක් දෙවිඳු රිය ආපසු හරවන ලෙස රියදුරුට අණ කළෝය. සතුරෝ පසුපස පැමිණියද සත්ව හිංසනයට අකමැතිව සතුරන් දෙසටම ආපසු එන සක් දෙවිඳු දුටු අසුරයෝ සක් දෙවිඳු නැවත යුද්ධයට එන්නේ යැයි සිතා ආපසු තම භවනටම පලා ගියහ. සක් දෙවිඳු තම යහපත් ක්‍රියාවේ ඵලය ඒ මොහොතේම ලැබ තම ජීවිතයත්, ගුරුළන්ගේ ජීවිතත්, දෙවියන්ගේ ජීවිතත් ආරක්ෂා කරගෙන තම දෙව්ලොවට ගියේය. ඔහු දහමින් දිනුවේය. ඒ නිසා දැහැමි සක්‍රයා රජෙකු වශයෙන් තම ප්‍රජාවගේද, සතුරාගේ හා එම ප්‍රජාවගේද දිවි රකියි. කිසිදු හිංසාවක් නොකරයි.

## 3. සිල්වතුන්ට ගරු කිරීම

සිල්වත්, ගුණවත් පිරිස රටකට, සමාජයකට සම්පතකි. එයට හේතුව අරගල අඩුවීම හා භේද භින්නතා නොවීමයි. එනිසා සිල්වත්, ගුණවත් සමාජයක් පාලනය කිරීම පහසුය. ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් අන්‍යෝන්‍ය සමගියෙන් යුතුව දිවි ගෙවයි. මේ සමාජයට දෙවිවරුද ප්‍රියය. සිල්වතා දෙවියෝ රකිති. එනිසා ඔහු වෙත බාහිර කරදර බාධක නොපැමිණේ. සක් දෙවිඳු සිල්වතුන්ට ගරු කරයි. සිල්වතුන් ඉදිරියේ පාවහන් නොදමයි. ආයුධ නොදරයි. හිස්වැසුම් ගලවයි. ඔවුන් දෙසට ඇඟිලි බැඳ වැඳගෙන සිටියි. මෙම සිරිත අතීතයේ සිට පැමිණ වර්තමානයේද පන්සලක දක්නට ලැබේ. එසේම දෙවියන්ට මිනිසුන්ගේ සිරුරු ගඳය, අපවිත්‍රය. නොඉවසයි. එහෙත් සක් දෙවිඳු සිල්වතුන්ගේ කයෙහි වැදී හමන සුළඟ කැමැති වෙයි. එය විසිතුරු මල්දමක් මෙන් හිසෙහි දරමින් සිටියි. එයට හේතුව නම් පාලකයාට සිල්වත්, ගුණවත් සමාජයෙන් රාජ්‍ය පාලනයට බාධක සිදු නොවන නිසාය.

## 4. සත්තවන පද (ගුණධර්ම හතක්) ආරක්ෂා කිරීම

සක්දෙවිඳු මිනිසත් බව ලැබූ අවධියේ ගුණධර්ම හතක් දිවි හිමියෙන් රැක්කේය. එහි ප්‍රතිඵලය ලෙස සක්‍රතාවය ලැබුවේය. ඒවා මෙසේය.

දිවිහිමියෙන් මව්පියන් පෝෂණය කිරීම.
දිවිහිමියෙන් කුලදෙටුවන් පිදීම.
දිවිහිමියෙන් මිහිරි වදන් කීම.
දිවිහිමියෙන් කේලාම් වදන් නොකීම.

කළ පරිත්‍යාගයෙහි ඇලුම් නොකිරීම, දන් දීමට වූ සිත් ඇත්තේ දීමෙහි ඇලුණේ අනුන් විසින් ඉල්ලන්නට සුදුසු අයෙක් වූයේ දානයෙහිත් ඒ ඒ අයට අවශ්‍ය වස්තු බෙදා දීමෙහිත් ඇලුණේ දිවි හිමියෙන් පහවූ මසුරු මලින් යුත් සිතින් ගිහිගෙයි විසීම.

දිවිහිමියෙන් සත්‍ය වචන කීම.
දිවිහිමියෙන් ක්‍රෝධ නොකිරීම, ක්‍රෝධයක් වී නම් එය වහා දුරු කිරීම.

මේවා සත්පුරුෂ ගුණාංගයෝය. තම දෙමාපියන් පෝෂණය කිරීම දරුවන්ගේ යුතුකමකි. තමාගේ අතපය විකෘති නොකර, මැසි මදුරුවන්ගෙන් ආරක්ෂා කර, කුසගින්නේ නොතබා බාහිර කරදරවලින් බේරා හදා වැඩූ දෙමාපියන් රැකගැනීම සත්පුරුෂ දරුවන්ගේ ගුණයකි. පරපුරේ වැඩිහිටියන්ට මූලිකත්වය දීම,



කිසිවකුට හානියක් වීම අගය නොකරයි. පරිත්‍යාගය වටිනා ගුණාංගයකි. දුන් දෙය ගැන නැවත නැවත නොසිතා හිතින් අල්ලා නොගෙන සිටීමත්, සිත් නිතර පරිත්‍යාගශීලී වීමත් තමා පරිත්‍යාගශීලී පුද්ගලයකු වශයෙන් සමාජයේ ප්‍රසිද්ධ වීමත් නිසා ගුණ සුවඳ පැතිරෙයි.

ක්‍රෝධය නිසා සිත් අපිරිසිදු වේ. තමාට අනුව අනෙක් අය, අනෙක් දේවල් පැවැතිය යුතු යැයි සමහරු සිතති. තමාට අනුව ලෝකය නොපවතින විට නුරුස්සයි, ගැටෙයි, කෝලාහල කරයි. මේ නිසා ක්‍රෝධය උපදී. එවිට කායිකව, මානසිකව ලෙඩ වෙයි. එවිට පුද්ගලයා අප්‍රසන්න වේ. ලෝකය ඔහුව ඈත් කරයි. ආයුෂ කෙටි වේ. එසේම ලෝකය හා නොගැටී සිටින විට ක්‍රෝධය නූපදියි. එවිට මෙත් සිතිවිලි උපදියි. සියල්ලන්ට ප්‍රිය වේ. සියල්ලෝම ප්‍රිය කරයි. එයින් කායිකව හා මානසිකව සුවපත් වේ. ප්‍රසන්න වේ. නිරෝගී වේ. දිගාසිරි විඳියි. මේ ගුණ ධර්මය සක් දෙවිඳු පෙර ආත්මවල පුහුණු කළේය. එනිසා එම පදවිය ලැබුවේය. දිනක් සක් දෙවිඳුගේ අසුනේ කළු දුර්වර්ණ වූ මිටි යකෙක් හිඳිනු තව්තිසා දෙවියෝ දුටහ. එහිදී තව්තිසා දෙවියෝ ඒ යකාට නින්දා කළහ. දොස් කීහ, අවමන් කළහ. මෙසේ සිය ක්‍රෝධය ප්‍රකාශ කළහ. දෙවියන්ගේ ක්‍රෝධය හමුවේ යක්ෂයා ප්‍රියකරු විය, දකුම්කළු විය. උසස් රූ ඇත්තේ විය. මේ බව තව්තිසා දෙවියන් සක් දෙවිඳුට කී කල්හි සක් දෙවිඳු යක්ෂයා වෙත පැමිණ දෙදණ බිම තබා වැඳ මම සක්දෙවිඳු බව තෙවරක් කීවේය. ඒ අසා යක්ෂයා මිටි වී, දුර්වර්ණ වී අතුරුදන් විය. මෙම කතා පුවතින් වැදගත් උපදේශයක් ලබාදෙයි. යක්ෂයා යනු සංකේතයකි. ක්‍රෝධය හමුවේ පුද්ගල සන්තානගත යක්ෂයා අවදි වී, ඌ ප්‍රකට වී පුද්ගලයා නොපෙනේ. එවිට යක්ෂයා පැහැපත් වී කෝප වූ පුද්ගලයා දුර්වර්ණ වේ. සක්‍රයාගේ ඉවසීම නිසා යක්ෂයා නැති වේ. ඉවසීම හමුවේ ක්‍රෝධය නොපවතී. ක්‍රෝධය හමුවේ ඉවසීම නැතිවී යක්ෂාවේශ වූ පුද්ගලයා ප්‍රකටව පෙනේ. මෙසේ පෙර භවවල ඉවසන්නට පුරුදු කළ නිසා සක්‍ර ජීවිත ලැබූ බව පෙනේ. ක්‍රෝධ අවස්ථාවේ ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ සක්‍රයාගේ අවවාදය මෙයයි.

ක්‍රෝධය ඔබලා යටපත් නොකෙරේවා.

කිපෙන්නවුන්ට නොකිපෙන්න.

ක්‍රෝධ නොකිරීමද, අවිහිංසාවද හැමවිට උතුමන් කෙරෙහි පවතී.

ක්‍රෝධය පහන් ජනයා මර්දනය කරයි.

සක්‍රයා පෙර මිනිසත් වූයේ ගුණවත්ව සත්පුරුෂ දිවියක් ගෙවූ නිසා මෙබඳු ගුණ නාම ලැබුවේය.

1. මඝ - මඝ නමින් සත්පුරුෂ තරුණයෙක් වී ජීවත් වීම.
2. පුරින්දද - පුරයක් පුරයක් පාසා සකසා දන් දීම.
3. සක්ක - මනාව සකස් කර දන් දීම.
4. වාසව - නිවාස, වාසස්ථාන ඉදිකර දීම.
5. සහස්සක්ඛ - මොහොතකින් දහසක් අරුත් සිතයි.
6. සුජම්පති - සුජා නම් අසුර කාන්තාවගේ සැමියා වීම.
7. දෙවානමින්ද - තව්තිසා වැසි දෙවියන් පිළිබඳ ඉසුරු බව හා අධිපති බව ඇතිව රජ කරයි.

අප අසා ඇති ආකාරයට සක් දෙවිඳු වෙත මේ ලොව කිසිවකුට නැති ආසනයක් වෙයි. එය හඳුන්වන්නේ ''පඬුපුල් අසුන'' යනුවෙනි. මනුලොව කිසිවකු හෝ දුකට, කරදරයට පත්වන විට එම පඬුපුල් අසුන උණු වන බවත්, එවිට සක් දෙවිඳු විවිධ වේෂයන් ගෙන මනු ලොවට වැඩම කොට එකී දුකට, කරදරයට පත් පුද්ගලයාට උදව්, උපකාර කරන බවත් අපි අසා ඇත්තෙමු. අද ඇතැමුන් විහිළුවට මෙන් පවසන්නේ පඬුපුල් අසුන නිතර ගිනිගෙන දැවෙන නිසා සක් දෙවිඳු මේ පඬුපුල් අසුනේ වාඩි නොවන බවය. ඒ තරමට මේ ලොව තුළ අපරාධ, අවනීතිය රජවී තිබේ.


''පඬුපුල් අසුනින්

බැස, ගියේද

සක් දෙවිඳුනි...'' යනුවෙන් අද අපට අසන්නට සිදුවී ඇත්තේ එනිසාය.


**ආචාර්ය එම්. එම්. මහින්ද හේරත්**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**

# පොල්තෙල් පහනක් දැල්වීමේ සැබෑ අරුත



බුදු දහම නීති රීති මගින් මිනිසුන් හික්මවන දහමක් නොවේ. ඒ අනුව බුදුගෙයි පහන් දැල්වීම සඳහා කෙනෙකුට පොල් තෙල් පහනක් මෙන්ම තව කෙනෙකුට විදුලි පන්දමකුත් භාවිතා කළ හැකි බව සිතිය හැකිය. මෙහිදී ප්‍රධාන වන්නේ සිතයි.

නමුත් ගැටලුව එය නොවේ. යම්කිසි දෙයකින් යහපතක් වන්නට නම් එය අපේ යටි සිතට කිඳා බැසිය යුතුය. උඩු සිත බොහෝ කුඩාය. ඊට සාපේක්ෂව යටි සිත ඉතා විශාලය. යටි සිතට යමක් පිවිසෙන්නට අංශ 3 ක් සම්පූර්ණ විය යුතුය.

1. **පැරණි වීම**
2. **සංකේතාත්මක වීම**
3. **අසාමාන්‍ය ගතියක් තිබීම**

එම අංශ තුන වේ.

මානවයාගේ යටි සිත ඉතාම පැරණිය. එනිසා යටි සිතට යමක් පිවිසෙන්නට එය පැරණි විය යුතුය. සංකේතාත්මක විය යුතු වන්නේ අතීතයේ අපට භාෂාවක් නොවූයෙන් සංකේත භාවිත කළ නිසාය. එසේම එය අසාමාන්‍ය ගතියක් තිබීමද වැදගත් වේ. ඕනෑම ආගමික දෙයකදී, විවාහ මංගල උත්සවයකදී, අවමංගල උත්සවයකදී පවා තදින් සිතට යමක් කා වදින්නට නම් මේ අංශ තුන සම්පූර්ණ විය යුතු වේ. චිත්‍රපටයක්, ටෙලි නාට්‍යයක් වුවත් අපේ යටි සිතට කා වදින්නේ මෙලෙසිනි.

විදුලි පන්දමකින් ආලෝකයක් ලැබේ. නමුත් එය පැරණි දෙයක් නොවේ. විදුලි පන්දම උඩු සිතට හුරු දෙයක් වුවත් යටි සිතට අලුත්ය. නමුත් පොල් තෙල් පහන එසේ නොවේ. එය අපට ඈත අතීතයේ සිටම හුරු පුරුදුය. ඒ අනුව අපේ යටි සිත දන්නේ බුදු රුව ඉදිරියේ තබන පහන යනු පොල් තෙල් වැනි තෙල් වර්ගයක් දමූ පහන් තිරයක් සහිත සුළඟට නිවෙන තෙල් අවසන් වී ගෙන එන විට තිරය වැඩි ආලෝකයක් විහිදුවමින් දිදුලන පහනක් ලෙසය. නමුත් විදුලි පන්දමක මේ කියන ගුණ එකක්වත් නැත. එබැවින් බුදුරුව ඉදිරියේ විදුලි පන්දමක් දැල්වීම පිළිගැනීමට අපේ යටි සිත සූදනම් නොමැත.

මේ ආකාරයට නවීකරණය කරන්නට යාම තුළ හැම දෙයක්ම නවීකරණය කිරීමට මිනිසුන් පෙළඹිය හැකිය. සිල් සමාදන් වන්නට සුදු ඇඳුමක් අවශ්‍ය නැතැයිද තිබෙන ඇඳුමක් ඇඳ එය කළ හැකි යැයිද ඇඳුමේ සීලය නැතැයිද යනුවෙන් මේ අයුරින්ම කෙනෙකු තර්ක කරන්නට ඉඩ තිබේ. ආගම යනු අපේ යටි සිතට ප්‍රබලව බලපාන දෙයකි. මෙසේ ඉවක් බවක් නැතිව හැමදේම නවීකරණය කරන්නට යාම ආගමට සංස්කෘතියට සේම අපේ මනසටද බෙහෙවින් අනර්ථකාරීය.

**- විශේෂඥ මනෝ වෛද්‍ය ඩී. වී. ජේ. හරිශ්චන්ද්‍ර**

බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි යුගයේදී විදුලි බලය තිබුණේ නැත. ඒ අනුව එකල ආලෝකය ලබාගැනීම සඳහා දැල්වූයේ පහන්ය. බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ශ්‍රාවකයා විසින් දල්වන ලද්දේද තෙල්වලින් දල්වන ලද පහන්ය.

නමුත් පහනක් දල්වන්නේ ඇයිද යන කාරණයද අද බොහෝමයක් දෙනාට අමතක වී ඇති බව පෙනේ. එනිසාම මහ දවාලෙත් විහාරස්ථානවල පහන් දල්වන අය අද බහුලය. විදුලි පහන් ඉතා දීප්තිමත්ව බබලද්දීත් පහන් දල්වන පිරිස් සිටිති. පහනක් දල්වන්නේ අඳුර දුරු කරන්නට බව මේ බොහෝ දෙනකුට අමතකව ඇති සේය.

නමුත් විහාරස්ථානවල පහන් දල්වන අය තුළින්ද විශාල ලෙසින් වැරදි සිදුවේ. පහන්වල පොල්තෙල් පිරී තිබුණත් එයට උඩින් නැවතත් තෙල් වත්කර ඒවා පහන්වලින් බේරී බිමට පතිත වීම පෝය දිනවලදී බොහෝ විටම දැකගත හැකිය. එසේම පහන් පූජාවක් උස් ස්ථානයක කළ යුතුවේ. වැලිමළුවේ දිගටම අවිචාරවත් අන්දමින් පහන් දල්වන්නේ එමටය. පොල්තෙල් බිමට වැටීම නිසා එම ස්ථානවල ඊළඟට කුහුඹුවෝ බෝවෙති. මෙවැනි වැරදි බෞද්ධ ජනතාව වෙතින් තුරන් විය යුතුය. සිදුවිය යුත්තේ එයයි. ඒ වෙනුවට පහන් පූජාව නවත්වා ටෝච් පූජාව පැවැත්වීම නොවේ.


**- කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි**

බුදු ගෙය තුළ පහන් දැල්වීම අනුමත කළ හැක්කක් නොවේ. පුරාවිද්‍යා ස්මාරක වශයෙන් නම් කර ඇති ස්ථානවල බුදු ගෙය තුළ පහන් දැල්වීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින්ම තහනම් කොට ඇත. ඒවායේ පිරිසිදු කිරීම් ඇතුළු සියලු කටයුතු කරන්නේත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින්මය.

විහාරස්ථානවල බිතු සිතුවම් සහ පිළිම අදළ පහන් දැල්වූ විට එහි දැල්ල කෙළින්ම වදින්නේ එම පිළිමවලට හා චිත්‍රවලටය. මේ දැල්ල ඒවායෙහි බැඳේ. මෙමගින් සිදුවන්නේ එම වටිනා සිතුවම් හා පිළිම විනාශ වී යාමය. පුරාවිද්‍යා ස්මාරක වශයෙන් නම් කර ඇති ස්ථානවල පිළිම හා චිත්‍රවල බැඳෙන දැලි ඉවත් කරන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් වෙනම කණ්ඩායමක් යැවීමට පවා සිදුවේ. එසේ පිරිසිදු කළත් බොහෝ විට එම වටිනා චිත්‍ර සහ පිළිම විනාශ වීම වළක්වා ගත නොහැකිය. මේ අනුව පුරාවිද්‍යා ස්මාරක සහිත ස්ථානවල බුදු ගෙවල් තුළ පහන් දැල්වීම තහනම් කර ඇත. එබඳු ස්ථානවල පමණක් නොව ඕනෑම විහාරස්ථානයක බුදු ගෙය තුළ පහන් දැල්වීම එහි විනාශය සඳහා හේතු වේ.

බෝධියටද පහන් දැල්ල අගුණය. ඒ නිසා මේවා ආරක්ෂා කරන්නට නම් බුදු ගෙය තුළ වගේම බෝධිය අසලත් පහන් නොදල්වා සිටීම ඉතාම වැදගත් කාරණාවකි.

**යූ. ඒ. ඩබ්ලිව්. ද සිල්වා**







# කඨින සිවුරු පිදීමේ ආනිසංස

"යාවතා සබ්බපරික්ඛාරේ සංඝස්ස සතතං දදෙ
එකස්ස කඨින දනස්ස කලං නාග්ඝති සොළසිං
ගිරිරාජ සමංරාසිං සංසෙ දෙති තිචීවරං
එකස්ස කඨින දනස්ස කලං නාගඝන්ති සොළසිං"

භික්ෂු සංඝයාට පූජා කරන ලොව සියලු දනයන්ට වඩා අග්‍ර වූ පූජාව ලෙස කඨින දනය හඳුන්වා තිබේ. මෙම ගාථා ද්වය භික්ෂු සංඝයා ඉදිරියෙහි අමාමෑණී බුදුරජාණන් වහන්සේ විසින්ද, එසේම බුදුරජාණන් වහන්සේ සහ සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලා පන්සියයක් තමන් ඉදිරියෙහිදී කඨිනයෙහි ආනිසංස දක්වමින් නාගිත තෙරුන් විසින්ද ප්‍රකාශ කරන ලද්දකි.



අර්ථය:

"**යවතා, සබ්බපරික්ඛාරේ**, යම්තාක් සියලු පරිෂ්කාරයන්, **සතතං**, නිරන්තරයෙන් **දිනපතා සංඝස්ස දදෙ**, භික්ෂු සංඝයාට දුන්නේ වී නමුත්, **එකස්ස කඨින දනස්ස**, එක් කඨින දනයකින්, **කලං නාග්ඝති සොළසිං**, සොළොස් කලාවෙන් එක් කලාවක් තරම් වත් එය නොවටනේය."

එහි සාමාන්‍ය අදහස නම් යම් සැදැහැවතෙක් භික්ෂූන් වහන්සේට අවශ්‍ය සියලු පිරිකර වූ තුන්සිවුරු, පාත්‍රාවාසි, ඉඳිකටු, කායබන්ධනය හෙවත් පටිය, පෙරහංකඩ, කරකැත්ත (දැලි පිහිය) ආදී වූ සියලු පරිෂ්කාරයන් නිරන්තරයෙන් දිනපතා පූජා කළත්, එය කඨිනයක් පිදීමෙන් ලබන ආනිසංසයන්ගෙන් සොළොස් ප්‍රමාණයෙන් එක් කොටසක ආනිසංසයක් පමණ වේ.

ලොව උතුම්ම වස්ත්‍රවලින් දෙපට සිවුරු, තනිපට සිවුරු, හඳන සිවුරු ආදී චීවරයන් මහ මෙර උසට ගොඩ ගසා පූජා කළත්, එයද කඨින පූජාවෙන් ලබන ආනිසංසයෙන් සොළොස් පංගුවෙන් එක් තරමක් පමණ වේ. මේ නිසා සියලු පූජාවන් මෙන් දහසය ගුණයක් වටිනා ආනිසංස ලැබිය හැක්කේ කඨින පූජාවෙනි. ඒ බැවින් සියලු පූජා අතර කඨින පූජාව අග්‍රතර හා ප්‍රමුඛද වේ.

**අටමහා කුසල්**

බුද්ධ ශාසනයෙහි උසස්ම ආනිසංස ගෙන දෙන මහා කුසල් අටක් විස්තර කර තිබේ. ඒවා නම්,

"කඨිනට්ඨ පරික්ඛාරං
වාසදනංච උත්තමං
බුද්ධපමුඛ සංඝස්ස දනං ධම්මස්ස ලෙඛනං
ඛෙත්තදනංච බුද්ධස්ස පරිමා කරණසිංච
කරණං වච්චකුටියා අට්ඨපුඤ්ඤාණි වුච්චරේ."

1. කඨින දනය, 2. අටපිරිකර පූජාව, 3. ආවාස සාද පිදීම, 4. බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් දීම, 5. ධර්මය ලිවීම, 6. කෙත් පිදීම, 7. බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිමා කරවීම, 8. වැසිකිළි කැසකිළි කරවීමද යන පූජාවන් අටමහා කුසල් යයි කියනු ලැබේ.

පුරාණ ආචාර්යවරයන් වහන්සේලා විසින් වර්ණනාවට භාජනය කර තිබෙන මේ සියල්ලෙන් ප්‍රමුඛස්ථානයෙහි ලා සලකා ඇත්තේ කඨින පූජාවය. ඉතිරි ඒවාද භික්ෂු සංඝයාගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය පූජාවන් වුවද, ඒවාට වඩා කඨින පූජාව අග්‍ර වශයෙන් ප්‍රශංසා කොට ඇත. කිසිවකු සිය ජීවිත කාලය තුළ පඤ්චානන්තරිය කර්මයක් සිදුකර ගෙන නොමැත්තේ නම් මිය යන මොහොතේ ඔහුගේ ඊළඟ ප්‍රතිසන්ධිය සඳහා ඉදිරියට පැමිණ පිහිට වන්නේ යටපත් කළ නොහැකි මෙම අට මහා කුසලයන්ය. එයින්ද කඨිනය ඉදිරියෙන් සිටියි.

**පූජ්‍ය මීගොඩ පඤ්ඤාලෝක හිමි**



# දළදා වඳින්න යන ඔබට හමුවන පූජනීය ගැටඹේ බෝධිය ගැනයි මේ


කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයේ පේරාදෙණිය 68 කණුව අසල පාර අද්දරම පූජනීය ගැටඹේ පැරණි බෝධිය දකිය හැක. පාරේ යන එන අප මෙන්ම සියලු අය නැවතී බෝධියට පඬුරු දැමීම චාරිත්‍රයයි. කාගේත් ගෞරවයට-වන්දනාවට මේ නිසාම ගැටඹේ බෝධිය ලක්වෙයි. ගැටඹේ සෙන්කඩගල නගරයට ඇතුළු වූ ප්‍රධාන තොටුපළක් විය. ඉපැරණි අඹ ගසක් නිසා හෝ ජලය සහිත බිම ගල් පර්වතයක් නිසා "ගැටඹේ" යන නම සෑදුණු බව සිතිය හැක. ඒ ගැට සහිත අඹ ගසක් නිසා හැදුණු බව කියන ජනප්‍රවාදය සත්‍යයක් නම් ඒ අතීතයේ මහවැලි ගඟ අද්දර තිබූ එකක් විය. ගැටඹේ බෝධිය අසල සිට පොලීසිය අසලින් ඇතුළට ටික දුරක් යනවිට හාල්මැහිකඳුර හමුවෙයි. ත්‍රිසිංහලයේ ගමන් මාර්ගවලදී පයින් ආ ගිය අය නැවතී පිරිසිදු සීතල දිය නා විවේක ගත් ස්ථානයක් ලෙස හාල්මැහිකඳුර ප්‍රසිද්ධය. ගැමුණු කුමරු පියා හා අමනාපව කොත්මලේට පලා යන විට හාල්මැහිකඳුර ළඟ නැවතී දිය නා මව්බිසව සකස් කර දුන් බත් මුල කෑ බව ජනකතාවල එයි. හන්තාන කන්දෙන් ගලා ආ සීතල පවිත්‍ර ජල උල්පතකින් හාල්මැහිකඳුර

නොසිඳෙන ජල කඳ එදා මතුවිය. අද මේ ස්ථානය පාළුවට ගොසිනි.

හත්වන සියවස පමණ අඳින ලද හිඳගල චිත්‍ර ගැටඹේ නුදුරුව ඇත. උඩරට රජකළ වීරවික්‍රම රජු ගැටඹේ තොටුපළදී පැවැත්වූ විශාල පින්කමක් ගැන චූලවංශය හා රාජරත්නාකරය විස්තර කරයි. මෙම වීරවික්‍රම හෙවත් වීර පරාක්‍රම සෙක්කඩගල මුල් යුගයේ සිටි ප්‍රාදේශීය රජෙකි. පළමු විමලධර්මසූරිය රජු (1592-1604) හා දෙවැනි විමලධර්මසූරිය රජු (1687-1707) රක්ඛංග රට සිට භික්ෂූන් වැඩමවා උපසම්පදාව ඇති කලේ ගැටඹේ තොටුපළේදීය. මේ අනුව ගැටඹේ මුල් කාලයේ උපසම්පදා තොටුපළක් ලෙස වැදගත් විය.

වීරසුන්දර බණ්ඩාර කුමරු කල පටන් පේරාදෙණියේ රජ පෙළපතක් හා ඔවුන්ට සීමා වූ රජ උයනක් මේ අවට විය. වීරසන්දර බණ්ඩාර කලක් සීතාවක රාජසිංහ රජු යටතේ උඩරට සාමන්තයා ලෙස (1581-1585) රජ කළේය. එහෙත් ඔහු රාජසිංහ රජුට විරුද්ධව කුමන්ත්‍රණ කළ බැවින් සීතාවක රාජසිංහ රජු විසින් ඔහු සීතාවකට කැඳවා බොරු වළකාලා මැරූ බව ''රාජාවලිය'' කියයි. ඒ මැරුම් කෑ වීරසුන්දර බණ්ඩාරගේ ඊළඟ උරුමක්කාරයා වූයේ පළමු විමලධර්මසූරිය ලෙස පසුකල ප්‍රසිද්ධ වූ දොන් ජුවන් කොණප්පු බණ්ඩාරයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු කල (1747-1782) උඩරට රාජකීයන්ට සීමා වූ පේරාදෙණියේ මල්වත්ත තිබූ බව ඩොයිල් කියයි. රාජාධි රාජසිංහ රජු කල වනවිට (1782-1798) මෙම පේරාදෙණිය රාජකීය මල්වත්තේ රජුගේ බිසවක් සඳහා රජ මැදුරක් රජ මාලිගාවක්ද විය. මහාධිකාරම් පිළිමතලව්වේගේ උපක්‍රමයක් අනුව ළදරු කන්නසාමි කුමරු අතින් රාජාධිරාජසිංහ රජු මැරුම් කෑවේද මෙම මල්වත්තේ පිහිටි රජ මාලිගාව අසලදීය. මහනුවර රාජධානියක් ලෙස දළදා පෙරහර ආරම්භයේ සිටම දිය කැපීම සිදුවූයේ මහවැලි ගඟේ ගැටඹේ තොටුපොළේදීය. මෙම දිය කැපුම් තොටුපොළේ දක්නට ඇති ඉපැරණි බෝධිය ''දිය කැපුම් බෝධිය'' නමින් ප්‍රසිද්ධය.

දෙවැනි රාජසිංහ රජු ඔහුගේ සහෝදරයෙක් වූ ඌවේ කුමාරසිංහ හා මාතලේ විජේපාලගේ සහය ඇතිව පෘතුගීසීන් අන්ත පරාජයකට පත්කළේ 1638 ගන්නෝරුව සටනේදීය. ගැටඹේ තොටුපොළ ආසන්නව මේ ඓතිහාසික ගන්නෝරුවම රණබිම ඇත. 1638 ගන්නෝරුවේ සටනින් පසු දෙවැනි රාජසිංහ රජුගේ කීර්තිය හැම තැන පැතිර ගියේය. සතුරන් ගන්නෝරුවේ කඳවුරු බැඳ සිටියදී දෙවැනි රාජසිංහ රජු ඒ අසල ඇති ගන්නෝරු කන්ද හෙවත් දිවි දොස් කන්දට නැග එහි සිට සතුරන් වෙඩි බෙහෙත් වේලන විට ගිනි ඇවිලූ කරුංකා ගෙඩියක් ඊයක බැඳ එවූ බව ජනප්‍රවාදයක එයි. (පඬුවස් දෙව් රජ කල ඒ රජුට වැළඳීතිබූ දිවිදොස් දුරලීමට එම රජු ඌරු වෙස් ගෙන පැමිණ නැවතුණු ස්ථානය දිවි දොස් කන්ද බව ''කුවේණි අස්න'' කියයි. මේ අනුව දිවිදොස් කන්ද පඬුවස්දෙව් යුගය දක්වා පැරණි වෙයි.) පෘතුගීසීන් පරදවා 1638 ගන්නෝරු සටනින් ලැබූ ජය සිහිවීමට දෙවැනි රාජසිංහ රජු කුමාරසිංහ කුමරු ලවා ජය සමරු බෝධි වෘක්ෂ තුනක් රෝපණය කරවීය. ඉන් පළමුවැන්න මේ ලිපියේ මාතෘකාවට මුල් වූ ගැටඹේ පූජනීය බෝධියයි. එය ගැටඹේ රාජෝපවනාරාමයේ ඇත. මේ බෝධිය දැනට අවුරුදු 365 ක් පමණ පැරණිය. ගැටඹේ බෝධියේ ප්‍රදාන ශාකා පහකි. බෝධිය පාමුල විෂ්ණු දේවාලයකි. මෙම බෝධියේ කීර්තිය වඩාත් පැතිර ගියේ 1947 ගංවතුරට මුළු ප්‍රදේශයම ගංවතුරෙන් යට වුවත් බෝධියට ගංවතුර නොගලා ආරක්ෂා වීම නිසාය. 1947 වනවිට මේ බෝධිය අවට කඩ පෙළක් විය. ගංවතුරට පසු මෙහි පදිංචිය තහනම් කලාපයක් විය. 1638 ගන්නෝරු සටනේ දෙවැනි ජයසමරු බෝධිය රෝපණය කළේ මහනුවර ඇසල පෙරහර දිය කපන ගැටඹේ බෝධිය ඇලය. මෙය වඩාත් ප්‍රසිද්ධ ගැටඹේ දිය කපන බෝධිය නමිනි. එයටද වයස අවුරුදු 365 ක් වෙයි. එහෙත් ගැටඹේ බෝධියට වඩා මෙම දිය කැපුම් බෝධිය දැවැන්තව වැඩී ඇත. එහි මුල වටා අඩි හතළිහකට වඩා වැඩිය.



මහනුවර නාථ දේවාලය හා මහනුවර පත්තිනි දේවාලයේ වැල් බෝධි මෙන් දිය කැපුම් බෝධියේද ශාඛා හරස් අතට වැලක් මෙන් විහිදෙයි. ඇසල පෙරහර දිය කපන දා මෙම දිය කපන බෝධිය ඉමහත් පුද පූජාවට පත්වෙයි.

1638 ගන්නෝරු සටනේ තුන්වෙනි ජයසමරු බෝධිය එදා රෝපණය කළේ පේරාදෙණිය මල් වත්තේය. 1820 පමණ ඉංග්‍රීසීන් විසින් පේරාදෙණිය මල් වත්තේ වූ ජයසමරු බෝධිය කපා දමන ලදී. (එහෙත් පේරාදෙණිය මල් වත්තේ පළමු විමලධර්මසූරිය රජු විසින් කරවූ විහාරය හා දාගැබ කාලයක් යනතුරු ඉතිරි වී තිබුණි.) මේ අනුව ගැටඹේ රාජෝපවනාරාම බෝධිය හා ගැටඹේ දිය කැපුම් බෝධිය 1638 ගන්නෝරු සටන සිහියට නංවමින් තවමත් විරාජමාන වෙයි.

**එස්. කේ. ජයවර්ධන**



# සසරෙන් මිදෙන මග කියන මහාජනක ජාතකය

මහාකාරුණික වූ, සණරාමර සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන කාලයෙහි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක. එක් දවසක් දම්සභාමණ්ඩපයට රැස් වූ සැරියුත්, මුගලන් ආදී භික්ෂූන් වහන්සේ, සර්වඥයන්වහන්සේ සුද්ධෝදන රජු වැනි පිය කෙනෙකුන්, යශෝධරා වැනි අගබිසවක්, සත්දවසකින් ලැබෙන චක්‍රවර්තී රාජ්‍යය වැනි රාජ්‍යශ්‍රීය හැරදමා මහභිනික්මන් කළ අයුරු කතිකා කරමින් සිටියහ. එබස් දිවකණින් ඇසූ බුදුරජාණන්වහන්සේ, තමන්වහන්සේ වැඩමකිරීමට පෙරාතුව කිනම් කතාවකින් යුක්තව සිටියේදැයි විමසා දැන, මහණෙනි, දැන් බුදුවන ජාතියේ පමණක් නොව ඊට පෙර කල ද රාජ්‍ය සම්පත් හැරදමා ගිහිගෙන් නික්මූ අයුරු දක්වා මෙම දේශනාව සිදුකොට වදාළ සේක.

පෙර දවස වේදේහ රට මියුළු නුවර මහාජනක නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි, අරිට්ඨජනක හා පොළෝජනක යැයි රාජකුමාරවරු දෙදෙනෙකු ලැබ, අරිට්ඨජනක කුමාරයා යුවරජ තනතුරට පත් කොට, පොළෝජනක කුමාරයා සෙනෙවිරත් තනතුරට පත්කොට දැහැමෙන් රට රාජ්‍යය කොට පරලොව ගියහ. එවිට අරිට්ඨජනක කුමාරයා රාජ්‍යයට පැමිණ, පොළෝජනක කුමාරයා යුවරජ තනතුරට පත්කර ගත්තේය. එවිට එක් ඇමතියෙක් මේ දෙදෙනා අතර භේදයක් ඇති කිරීමට සිතා බොරු කියා වරක් දෙවරක් නොව කීපවරක් එකම දේ පවසා යුවරජු රජකම ගන්නට එතැයි අසත්‍යයක් පවසා සහෝදරයන් දෙදෙනා බිඳවූහ.

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

අවසානයේ දී ස්වකීය සහෝදරයා ගැන සැක සිතා යුවරජු සිරගෙයෙහි ලැවූහ. යුවරජු බොහෝ දුක්විඳ මගේ සහෝදරයා මා නොකළ වරදක් නිසා මට දඬුවම් කළේයැයි සිතා සත්‍යක්‍රියා කළේය. තමා කයින් වචනයෙන් කිසිම ද්‍රෝහීකමක් නොකරන ලදැයි සිහිපත් කොට සත්‍යක්‍රියා කොට, ඒ බලයෙන් මාලාදාමයක් පිපිරීමට සලස්වා ඒ හා සමඟ සිරගෙයි දොර ඇරුණු විට, සිරගෙයින් පළා ගොස් ඈත ගමක මිනිසුන්ගේ සිත්ගෙන වෙස්වලාගෙන ජීවත්වූහ.

ඔහු ද ඇත් අස් පාබල සෙනඟ රැස් කොට ගත්තේය. අරිටුජනක රජු යුවරජු කරා ගිය විට, නුඹවහන්සේ පළමුව මට කිසිම වරදක් නොමැතිව සතුරු වුවද ඊට පෙරින් මගේ සතුරුකමක් නොතිබිණ. නමුත්, දැන් සතුරු වී ඔබ හා යුද්ධ පිණිස එන්නෙමැයි දැන්වීය. අරිටුජනක රජුත් එපවත් අසා කෝපයට පත්ව සේනා සමඟ සටනට ගොස් යුද්ධ කළාහ. අරිටුජනක රජු යුද්ධයෙන් පරාජය ලබා මරණයට පත්විය. යුද්ධයට යාමට පෙර අරිටුජනක රජුගේ අගබිසව ගැබ්ගෙන සිටියාය. ඇය රජු මියයාමට පෙර දූන් උපදෙස් මත මුතු මැණික් ආදී අනර්ඝ වස්තු රැගෙන වැරහැලි ඇඳගෙන තමන් අඳුනන රටක් ගමක් නැති හෙයින් කාළචම්පායි නම් නුවර බලා නික්මුණාහ. බඩෙහි පිරිසිඳ සිටි දරුවා නම් අප මහබෝසතාණෝය. බෝසතුන්ගේ ආනුභාවයෙන් ශක්‍රයාගේ පඬුපුල් අසුන උණු වී මහළු වේෂයෙන් පැමිණ, පා ගමනින් යන බිසවට රියකට ගොඩවීමට අඬගැසුවේය. බිසව තමා ගැබ්ගෙන සිටින බව පවසා, රථයෙහි නොනැග ගෙනගිය පසුම්බිය පමණක් රථයෙහි තබා රථය පසුපස ගියාය. එසේ යන අතරතුර එක්තරා අඹගසක් මුල රථය නවතා පළාබත්මුලක් බිසවුන්ට දී, බිසවුන් එය කෑ පසු දිව්‍ය වස්ත්‍රයක් දී රියට නැග විවේක ගන්නැයි කීය. බිසව ශක්‍රයා කී ලෙසම රිය තුළ නිදාගත් විට දිව්‍ය බලයෙන් නියමිත තැනට පැමිණියහ. සැට යොදුනක් පමණ මග ගෙවා පැමිණ කාළචම්පායි නුවර වාහල්කඩ ළඟ දී ශක්‍රයා ආපසු දිව්‍ය භවනට ගියේය.

එනුවර ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක් ඇය දැක කොයි යන්නේදැයි විමසා තමා අරිටුජනක රජුගේ අගමෙහෙසිය බවත්, එතුමන් සටනින් මළ හෙයින් දරුවාගේ ගර්භය ආරක්‍ෂා කර ගැනීම පිණිස මෙහි ආවායැයි පැවසුවාය. එවිට බමුණා ඔබගේ නෑසියන් මෙහි ඇත්දැයි විමසා, ඔබ මගේ පා ළඟ වැටී ශෝකයෙන් අඬා වැටෙන්නැයි සලස්වා, බමුණාත් එසේම ඇඬූහ. එවිට අතවැස්සෝ කුමක් නිසා අඬන්නේදැයි විමසූ විට කලකින් හමුවූ මැය මගේ නැඟණියෝයැයි කීහ. එවිට මිනිසුන් බැමිණියට නැඟණිය මුණගැසුණු බව දන්වා යවන ලදී. මග දී හමුවූ පසු නැඟණිය හිස් සෝදා නා, බමුණු ගෙට ගියහ. බමුණාගේ බැමිණියට තමන් නෑයෙක් බව අඟවා එහි සිටිනා අතර, ගුණනුවණින් වැඩුණු බෝසතාණන් උපන් සේක.

ඔහු වැඩිවිය පැමිණ අනෙකුත් ළමයි සමඟ සෙල්ලම් කරනාතුර, මේ වැන්දඹුවගේ දරුවා යැයි කී විට බෝසත් කුමරුවෝ මව හමුවී 'මෑණියනි, මගේ පියාණන් හා නෑදෑයන් කොයිදැයි' විමසීය. කීප වරක්ම ඇවැටිලි කළෙන්, ඔබේ පියාණන් යුදබිමේදී මියගිය බැවින්, ආරක්‍ෂාවට මුතු මැණික් රැගෙන පැමිණි බව දන්වා සිටියාය. එවිට කුමාරයා ඒ මුතුමැණික් වලින් භාගයක් රැගෙන වෙළඳාමක් කරනු සඳහා වෙළඳුන් පන්සියයක් සමඟ නැවකින් ගමනට නික්මුණේය. එදවස්හි පොළෝජනක රජු ගිලන්ව සිටියේය. මහබෝසතාණන් ගමන් ගත් නැව වටා ද මස්කැස්බෑවෝ වටකොට සිටියහ. කුමරුන් නසන්නට උත්සාහ කළ අවස්ථාවේ මස්කැස්බෑවන් වටකොට ගත් හෙයින් බෝසත් කුමරුන් නැවේ කුඹගසට නැගී ඉස්බක් පමණ දුරට පීනා ගියේය. මේ අතර පොළෝජනක රජු වැළඳුනු ව්‍යාධියෙන් පරලොව ගියේය.

බෝධිසත්වයන් සත්දවසක් සමුද්‍රයෙහි පිහිනා, පිරුණු පොහොය දැක ලුණුපැනින් කට සෝදා, අටසිල් සමාදන්ව තවදුරටත් පීනන අවස්ථාවේ සිල්වත් ගුණවත් දිව්‍ය ස්ත්‍රියක් දියේ පීනා එන කුමරු දැක මුහුදේ පීනන මේ කුමාරයා මළ හොත් නොමැනවැයි සිතා ළඟට ගොස් ආකාශයේ පෙනී සිට සමුද්‍රයේ පීනා පරතෙරක් දකින්නේ කෙසේදැයි විමසා සිටියාය. එවිට බෝසත් කුමරු ධෛර්යය ඇති අයට කළ නොහැකි දෙයක් නැතැයි පවසා ඊට වීර්යය කරමියි කියා සිටියේය. එවිට දෙව්දුව, පරතෙරක් නොපෙනෙන සයුරේ වීර්යය කිරීමෙන් ඇති පළක් නැතැයි කී විට, බෝසත් කුමරු, දිව්‍ය ස්ත්‍රිය, වීර්යය කළවුන්ට නොසැදෙන දෙයක් නැත. වීර්යය නොකොට මියගිය කෙනෙක් ගැන ඇසූ විට අසවලා මඳක් හෝ වීර්යය නොකොට මියගිය බව පවසයි. එබැවින් වීර්යය කරන්නෙමැයි පවසා ඔහුගේ වීර්යය බලයෙන් පරතෙරක් නොපෙනෙන මුහුදේ පීනන්නට වන් කල දෙව්දුව සතුටුව තුන්වරක් සාධුනාද පවත්වා, තමාගේ පුතෙකු වඩාගත්තාක් මෙන් සතුටුව උරයෙහි සතපා දෙව්දුව මියුළුනුවර උයනේ මඟුල් වනය මත්තේ කුමරා තබා, දෙව් විමානයට ගියාය.

පොළෝජනක රජු මියයාමට පෙරින් එතුමන් ඇවෑමෙන් රාජ්‍ය පවරන්නේ කාටදැයි විමසූ තැනේදී, තම දියණියගේ සහකරු වශයෙන් සොළොස් මහානිධානය තිබෙනා තැන් කියා එය පෙන්වූ කෙනෙකුට දියණිය විවාහ කර දෙන්නටත්, ඔහුට රජකම පවරා දෙන්නටත් කියා සිටියහ. රජු ස්වර්ගස්ත වූ පසු සියලු දේ බිසවගෙන් විමසා කවුරු රාජ පාලනයේ යොදවන්නේ දැයි දතමනා බව සිතා පළමු කොට උඩුමාලට සෙනෙවිරත් යැවුවාහ. සෙනෙවිරත් තමන් ආ නියාව බිසවට දැන්වූහ. බිසවු සෙනෙවිරත්ට එන්නට කී විට ඔහු පැමිණි පසු මොහුගේ ධෛර්යය බලන්නට උවමනා යැයි සිතා සඳළුතලය වට දුවන්න යැයි කීවාය. දුව ගොස් ළඟට පැමිණ රැඳී සිටි කල්හි පය අල්වන්නැයි කියා පය අල්වාගෙන සිටි සෙනෙවිරදුන්ගේ ළමැදට පයින් ඇනහෙලා බෙල්ලෙන් අල්වා පාතට දැමූහ. එවිට සෙනෙවිරත් කරබාගෙන ගෙට ගිය කල්හි බිසවුන්ගෙන් අභිප්‍රාය දැනගත්තේදැයි විමසූ විට සෙනෙවිරත් තමන්ට සිදුවූ ගැහැට නොකියා, යකින්නක් හා සමානය. මා සමඟ කිසිවක් කථා නොකොට තොපමාව ගෙට යන්නැයි පළවා හරින ලදී. එබස් ඇසූ අනෙක් ඇමතියෝ එසේ නම් මම බිසවුන්ගේ සිත ලබමියි සිතා වෙන පාරක ගියහ.

මේ නියාවෙන් සත් දවසක් ගතවූ විට පුරෝහිත බමුණා පැමිණ අමාත්‍යයන්ට මෙසේ කියා රජ්ජුරුවන් නැති රාජ්‍යය යහපත් නොවන්නේය. එසේ හෙයින් පුස්රථය නුවර ඈර පින් ඇති කෙනෙකුන් දිශාවට රථය තෙමේම ගොස් සිටියේ නම් ඔහු රාජ්‍යයට ගම්හයි කියා පුස්රථය පිට සේසත, නළල්පටය, රුවන් මිරිවැඩි, රුවන් චාමර, මඟුල් කඩුව යන පංචකකුද භාණ්ඩ තබා සිවුරඟ සෙනඟ සමඟ යන්නාහ. රජදරුවන් නැගි රථය හෙයින් සිවුරඟසෙනඟ පස්සේ යන ලෙස සලස්වා මන්ත්‍රය පිරුවා රථයට පැන් ඉස පින් ඇති කෙනෙක් ඇත්නම් ඒ පිනැත්තා කරා යේවායි රථය පිටත් කළහ. ඒ රථය, රජගෙයි තුන්විටක් පැදකුණු කොට එතැනින් පිටත්ව නුවර තුන්විටක් ප්‍රදක්ෂිණා කොට, නුවරින් පිටත්ව මඟුල් උයන කරා නික්මින. එවිට බොහෝ අමාත්‍යයෝ රථය තමන්ගේ ගෙයි කරා යතැයි සිතූ සිතුවිල්ල අතහැර රථය උයනට ගිය හෙයින් පළමු ගොස් අභ්‍යාසය නිසා එයි. රථය වළක්වයි අමාත්‍යයෝ කීහ. එබස් අසා පුරෝහිතයා කියන්නේ, කොයි යතත් නොවළක්වයි කීහ.

රථය උයනටම ගොස් බෝධිසත්වයන් වැදහොත් ශාලාවට ගොස්, නුවරට මුහුණලා බෝධිසත්වයන්ට පිටුපා සිටියේය. එවිට පුරෝහිතයා ගොස් බෝධිසත්වයන් පය වසා තිබූ හිණිකඩ ඉවත් කොට, පය ලක්‍ෂණ බලා, මුළු දඹදිව රාජ්‍යය කරන්නට ලක්‍ෂණ ඇති නියාව දැන, නැවත ධෛර්යය බලනු වස්, පංචාංගික තූර්ය නාදයෙන් එක හෙළා ධූරය කරවීය. එවිට බෝධිසත්වයෝ ඊට චකිතයක් නොවී, දකුණු දිශාවට නැමී වැදහොත්තාහ. එවේලෙහි බ්‍රාහ්මණයා ගොසින් කියන්නේ, ඔබ මේ මියුළු නුවර රාජ්‍යය පැමිණියේය. ඇයි මේ නුවර රාජ්‍ය කරන රජු නොමැතිදැයි විචාළ විට, අදින් සත් දවස රජු ස්වර්ගස්ත විය. එබස් අසා රජුගේ දරුවන් නැත්දැයි ඇසූහ. සීවලී කුමරියා මිසක් රාජකුමාර කෙනෙක් නැත. ඒ අසා යහපතැයි ගිවිස්සාහ. එවිට රුවන් රැසක් පිට සිටුවා සෝදා නහවා අභිෂේකාදිවූ කළමනා සිරිත් කරවා, රථයේ පිට නංවා මහත් පෙරහරින් නුවරට වඩාගෙන ආහ.

ඒ නුවරත් මහාජනක රජුගේ ආඥා යැයි කියා ආඥා පතුරුවා රජගෙට වන්හ. සීවලී කුමරිය රජු ආ පුවත අසා සෙස්සන් තමා රවටන්නේ යැයි සිතා තමන්ගේ මිනිසුන් අත වහා වඩිනු යහපතැයි කැඳවා යැවූහ. ඊට චංචලව වහා නොගොස්, සෙමෙන් සිට මාළිගාවේ සිතුවම් දෙස බල බලා බිසවු ගෙට ගියේය. රජු සතරැස් යානාව දැක ඉස තිබූ රන්ඉද්ධ ගලවා බිසොවුන් අතට දුන්හ. බිසවු ඒ රන්ඉද්ධ ගෙන ගොසින් ඉස්දොර තැබූහ. එවිට රජු ඉස් දොර දැක තොපගේ රජු ස්වර්ගස්ත වන ගමනේ දී කී දෙයක් ඇත්දැයි විචාළහ. ස්වාමීනි, සීවලී කුමරියගේ අභිප්‍රාය ලත් යම් කෙනෙක්

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

ඇත්ද, සතරැස් යානයේ ඉස්දොර දැනගත් කෙනෙක් ඇත්ද, දහසක් දෙනා නගාලන බාලන දුන්නේ දියලූ කෙනෙක් ඇත්ද, සොළොස් මහා නිධානය දත් කෙනෙක් ඇත්ද ඔවුන් රාජ්‍යයට පමුණුවන්නැයි කී බව පැවසූහ. එබස් අසා සොළොස් නිධානයේ ලක්‍ෂණ අසා සොළොස් මහා නිධානයන් පවතින තැන් කියා එබස් අසා රජු සීවලී බිසොවුන් මට ලැබෙන නියාව දන්නවාදැයි යාන ඉස්දොරත් මේ යැයි කියා, යාන පිට ඉඳ දුන්න ගෙනවාගෙන දහසක් දෙනා ඇදහලන දුන්න ස්ත්‍රියක රෙද්දක් අදින්නාක් සේ යාන පිට ඉඳම දුන්න දිය ඇදලා, සොළොස් නිධානය පානා රජ්ජුරුවෝ, තොපගේ රජගෙට සිඟා එන පසේබුදුන් කෙනෙක් ඇත්දැයි අසා, එතැයි දැනගෙන ඉර නැගෙන තැන නිධානය පසේබුදුන්වහන්සේ ඇවිත් වැඩසිටිනා තැන ඉර බස්නා තැන නිධානය නම් කියා සොළොස් මහා නිධානය කීමෙන් රජ්ජුරුවන් කී තවත් දෙයක් ඇත්දැයි විමසා, දන්සැල් කරවා මහත් දාන පරිත්‍යාග යාචකයන්ට සලස්වා රාජ්‍යය කරන්නාහ. අවශේෂ රජවරුත් රජුගේ තොරතුරු විමසා දැන පඬුරු එවන්නාහ. එසමයෙහි රජ්ජුරුවෝ තමන්ගේ



මෑණියන්ට හා තමාට උපකාර කළ දිසාපාමොක් ආචාරීන්ට පඬුරු යවා, ගම් බිම් දී රැක්කාහ. එක් දවසක් නුවර විජයපුරය සේ සරසා ශක්‍රදේවේන්ද්‍රයා මෙන් සැරසී සිංහාසනාරූඪව වැඩහිඳ ඇමති පර්ෂද් හමුවේ නාටක ස්ත්‍රීන්ගේ නැටුම් ගැයුම් දැක පෙර කරන ලද කුසල බලයෙන් කිසි අසීරුවකින් තොරව රාජ්‍යය ලැබ මෙලොව පරලොව දැන පසේබුදුන්වහන්සේට දන්දී වාසය කළහ.

එසමයෙහි සීවලී බිසොවුන් රාජකුමාරයෙක් වැදූහ. ඒ කුමරුට දීර්ඝායු යැයි නම් තැබූහ. ඒ කුමාරයාට සොළොස් හැවිරිදි වයස් වූ කල යුවරජ තනතුර දුන්නේය. දිනක් උයන්ගොව්වෙක් උයන් පළ වැල ගෙනගොස් රජුට පෑහ. රජු ඒ දැක යහපතැයි අප උයනට යම්හයි කීහ. එහි ඵලදාව ඇති අඹරුකක් ද, ඵලදාව නැති අඹරුකක් ද දැක, ඵලදාව ඇති ගසින් අඹ කඩා අනුභව කර, පසුව එන විට අඹ කඩා තියන්නැයි කියා ආවේය. පසුව යන විට යුවරජ සෙනෙවිරත් ආදීන් විසින් පොලු ගසා අඹ කඩා බිඳ දමා තිබිණ. ඵලදාව නොමැති අඹගසට කිසිදු හානියක් වී නොතිබිණ. රජු දවල් දවස උයන්කෙළ හවස උයනින් යන්නාහු ඵලදා ඇති ගසෙහි අඹවලට වූ හානිය දැක කරුණු විචාළහ. රජතුමනි ඵලදා වෘක්‍ෂය විනාශ විය. නොඵලදා වෘක්‍ෂයට කිසිදු හානියක් නැතැයි කීහ.

මේ ඇසූ රජු සම්පත් ඇතිවීමෙන් වන හානිය දැන රජගෙට අවුත් ගිහිගෙයි ඇලුම් හැර මහණ වීමෙහි කැමැත්ත ඇතිව ඇමතියෙකු ලවා එකවේලක බත් හා දැවැටි ආදී වූ දෙය අරගෙන උඩුමාලට එන්නැයි පවසා සත්මසක් තිස්සේ පාතමාලයට නොබැස තපස් රැක්කාහ. නගරවාසීහු රජු සත්මසක් තිස්සේ සිනාවක් නැතිව උඩුමහලේ භාවනා කරමින් වැඩ සිටින්නේය. මේ කිම්දැයි මියුළු නුවර කෝලාහල විය. මහාජනක රජුත් පසේබුදුන්ට පුදසත්කාර කරමින් මහණ වන අපේක්ෂාවෙන් රාජ්‍යයෙහි කළකිරී, කවරදා නුවර හැර ගොස් මහණ වෙම්ද? රත්‍රං, අමුරන් ආදී දෙයින් වූ භාණ්ඩාගාර හැරදා කවරදා මහණ වෙම්ද? දිව්‍ය ස්ත්‍රීන් වැනි ස්ත්‍රීන් හැරදා කවරදා මහණ වෙම්ද? ආදී ලෙස සිත සිතා කල් ගෙවූහ. මනුෂ්‍යයන්ගේ ආයුෂය දසදහසක් අවුරුදුය. රජුගේ ආයුෂය සත්දහසක් ඉක්මවී තිබිණ. එවිට රජු කාටත් නොහඟවා තුන්සිවුරු පාත්‍ර ගෙන වීදියට ගොස් මඟුල් කපුවා ලවා හිසකේ කප්පවා මහණ වූහ. සීවලී බිසොවුන් උඩුමහලේ සිට එසේ යන රජු ඇඳිනගත නොහී පසේ බුදුනැයි සිතා වැඳ උඩුමාලට පැනනැංගාහ. රජුත් රාජාංගන මධ්‍යයෙන් නික්මුණාහ. උඩුමාලට ගිය සීවලී බිසව රජුගේ කෙස්වැටිය හා ආභරණ දැක, එසේ වීනම් ගියේ ස්වාමීන් වනැයි සිතා, බිසොවුන් සත්සියය සමඟ අඬාවැටෙමින් රජු නික්මයන මග වැළැක්වීම සඳහා මහාසේනා සමඟ පසුපස්සේ ගොස් ගමන වැළැක්වීමේ අටියෙන් බාධක රැසක් සිදුකළාය. නමුත් රජතුමා නොනැවතී තපස් රකින්නට පිටත්ව ගියේය.

මේ නියායෙන් සැටයොදුනක් පමණ ගිය තැන නාරද නම් තාපස කෙනෙක් හිමාලයේ ගල්ගුහාවෙක්හි සත්දවසක් ධ්‍යානයෙන් දවස් යවා, සත්වන දවස ධ්‍යානයෙන් නැගී, මට වූ සැපය යහපතැයි සිතා මෙවැනි සැපතක් තවත් කෙනෙකු පතන්නේදැයි සොයා ආකාශයෙන් ගොස් රජ්ජුරුවන් කරා එළඹ රජතුමනි, ඔබ කොහි යන්නේ ද? ඔබට පංචකාමයේ සැපය හැර තපස් රැකිය හැකිද? තපස් රැකීම නම් කොපමණ ආයාසකර ද? පමණ දැන ආහාර වැළඳීම ද, උකටලී නොවීම ද, අලස නොවීම ද, පංචකාමයේ ඇල්ම ඇරීම ද දුෂ්කරය. තපස් රැකීමෙහි දුෂ්කරතා දක්වා සංසාරයෙන් ගැළවීමට නම් උගහට බව පැවසීය. තපස්සු සමඟ ගල් ගුහාවට ගොස් තපස් රැක මම පංචකාමයෙහි ඇලුම් ඇර මහණ වීමි. බෝධිසත්වයෝ ද ගසක් මුල වැඩහිඳ මෛත්‍රී භාවනාව කොට කය සතපාගෙන නික්මුණාහ. සීවලී බිසව සේනාව සමඟ පසුපස එද්දී ඔබ මගේ බිසව නොවේ. මට නින්දා නොකර ආපසු යන්නැයි සීවලී බිසවට පවසද්දී අමාත්‍යයන් සමඟ දීඝායු කුමාරයා ඔටුනු පළඳවා පසුව මහණ වන්නැයි කී විට ඒ සියල්ල ප්‍රතික්ෂේප කොට ගිහි ගෙය හැර දමා මහණදම් පිරූ වග කියැවෙන මහාජනක ජාතකය දේශනා කොට වදාළ සේක.

එසමයෙහි මණිමේඛලා නම් දිව්‍ය ස්ත්‍රිය, උපුල්වන් මහස්ථවිරීන්වහන්සේය. මිගාරජින තාපසයෝ නම්, මුගලන් මහස්ථවිරයෝය. නාරද තාපසයෝ නම්, සාරිපුත්‍ර ස්ථවිරයෝය. වැලිකෙළි කළ කුමාරිකා නම්, දකුණත් සව් ඛේමා මහස්ථවිරීන්වහන්සේය. එසමයෙහි ඊවඩුවා නම්, ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මහස්ථවිරයන්ය. සීවලී බිසව නම්, යශෝධරා මහස්ථවිරීන් වහන්සේය. දීඝායු කුමරු නම්, රාහුල මහස්ථවිරයන්ය. පිය වූ අරිටුජනක රජු නම්, සුද්ධෝදන මහරජුය. මව්බිසොවුන් නම්, මහාමායා දේවීන්ය. මහාජනක රජු නම්, දේවාතිදේව වූ, සමන්තභද්‍ර වූ බුදුන් වූ මම ම වේ යැයි මහාජනක ජාතකය දේශනාකොට නිමවා දේශනා කොට වදාළ සේක.

මෙසේ සියලු සැප ඇති රජසැප හැරදා ඇලුම් කළවුන්ගෙන් නික්ම ගිහිගෙය හැරදා යාම සාමාන්‍ය කෙනෙකුට කළ හැක්කක් නොවේ. කුසල් දහම් පුරණ නෙක්ඛම්ම පාරමී පූරණය කරන අය විසින්ම ඉටු කළ හැක්කක් වන්නේය. සසර සයුරෙන් එතෙර වීමට නම් සසරෙහි බැඳ තබන ගිහිගෙයින් නික්ම යා යුතුය. ඒ බව කියාපාන මහාජනක ජාතකය නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පූරණය කරන කාටත් ආදර්ශයට ගත හැකි වන්නේය.

**කේ. මීගහකුඹුර**


"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්."

# සදහම් ප්‍රහේලිකා අංක - 89

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 89, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය ඔක්තෝබර් මස 14 දාය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




### ▶ හරහට

1. සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත් ගුරුවරයා.
3. ෂඩ්වර්ණවලින් එකකි.
6. ප්‍රථම ධර්මදූත පිරිස ධර්ම ප්‍රචාරය ආරම්භ කළ පොහොය.
7. මෙය පුෂ්පයක අගය වැඩි කරයි.
8. මනුෂ්‍ය වර්ගයාව මේ නමින්ද හැඳින්වේ.
11. දෙරගුලු විවෘත කරගැනීමට මෙය උපකාරී වේ.
13. වාතය මෙන්ම මනුෂ්‍යයාට මෙයද අත්‍යවශ්‍යය.
14. පැරණි වෙළෙඳුන් තම බඩු රැගෙන යාමට මෙය භාවිත කළහ.
16. සමහර උදවියගේ හිත් තුළ මෙයද ඇත.

### ▼ පහළට

2. දෙළොස් මහා පෝයන්ට අයත්ය.
4. මාර දූවරු තිදෙනාගෙන් කෙනෙකි.
5. අටපිරිකරට අයත්ය.
6. සූර්යාව මේ නමින්ද හැඳින්වේ.
7. අසූමහා ශ්‍රාවක ස්ථවිරයන්ගෙන් කෙනෙකි.
9. බෞද්ධ කොඩියේ මේ වර්ණයද දක්නට ඇත.
10. ඉන්ද්‍රිය සංවරණයෙන් අගතැන් පත්වූ තෙරණුවෝ.
12. තුන්බිය නැතිකිරීම සඳහා දේශනා කළ සූත්‍රය.
13. ඖෂධීය ගුණ ඇති ගසකි.
14. ත්‍රිවිධ අකුසල් මූලයකි.

### ප්‍රහේලිකා අංක 87 ජයග්‍රාහී වාසනාවන්තයින්

- **චලනි අමරසිංහ, 217, යටිහලගල, පල්ලේගම.**
- **පුෂ්පකුමාරි, 165, සුමංගල මාවත, අස්ගිරිය, මහනුවර.**
- **ටී. සරත් කුමාර, ශ්‍රීපති පිරිවෙන, දියකලමුල්ල, කුලියාපිටිය.**

---

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සෑම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහයකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක<br>
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය<br>
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න

www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සොභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.



# ශ්‍රී දළදා මාලිගාවේ කඨින පින්කම ඔක්තෝබර් 30/31 දිනවල

**මහනුවර** ශ්‍රී දළදා මාලිගාවේ කඨින චීවර පූජෝත්සවය 2015 ඔක්තෝබර් මස 30-31 දෙදින තුළ පැවැත්වේ. අමුතු මුළුතැන් පූජාව සහ මහා කප්රුක් සහිත කඨින චීවර පූජාව සිදුකෙරෙන අතර සියක් නමකට අධික ගරුතර මහා සංඝරත්නය විෂයෙහි අටපිරිකර සහිතව පිරිනැමෙන අසදෘස සංඝගත දක්ෂිණාවකි. ඔක්තෝබර් මස 30 වැනි දින සවස 7.15 ට ශ්‍රී දළදා සමිඳු උදෙසා පිරිනැමෙන ගිලන්පස බුද්ධ පූජාවකි. මෙදිනම සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවකි.

මහනුවර කටුකැලේ ලේඩිබ්ලේක් ආරාමාධිපතිනි කොත්මලේ සුධර්මා සිල් මෑණියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙවර කඨින පින්කමේ දයකත්වය කොළඹ ග්‍රෙගරි මාවතේ අංක 47/3 දරණ නිවසේ පදිංචි සංජීව වික්‍රමනායක මහතා සහ රොසෑන් විජේනායක මහත්මිය විසින් දරනු ලබන්නේය.

කොළඹ ග්‍රෙගරි මාවතේ පිහිටි සංජීව වික්‍රමනායක මහතාගේ නිවසේ සිට පංචතූර්ය නාද සහිත කවිකාර මඬුල්ල සහ පිරිත් සජ්ඣායනාව මධ්‍යයේ විසිතුරු රන්සිවි ගෙයක් සහිතව රථ පෙරහරකින් කඨින වස්ත්‍රය කටුකැලේ ලේඩි බ්ලේක් ආරාමයට වැඩමවා පසුදින අලුයම අලි ඇතුන් සහිත පංචතූර්ය නාදය මධ්‍යයේ පෙරහරකින් කඨින චීවරය ශ්‍රී දළදා මාලිගාවට වැඩමවාගෙන අවුත් එදින කඨින චීවර වස්ත්‍රය සඟ සතු කොට පිළිගැන්වේ. එදින උදේ, දවල් මහා කප්රුක් සහිත කඨින චීවරය සහ සංඝගත සපිරිකර දක්ෂිණාව සඟ සතු කර පූජා කෙරේ. කොත්මලේ සුදර්මා සිල් මෑණියන් ශ්‍රී දළදා මාලිගාව මුල්කරගෙන සිදුකරන කඨින පින්කම් මාලාවේ පනස්වෙනි (50) කඨින මහා පින්කම 2015 සිදුකරන මෙම කඨින පූජෝත්සවය වේ. මෑණියෝ මුලින්ම කඨින පින්කම ආරම්භ කරනු ලැබුවේ 1965 වසරේදීය.

## බොදු පුවත්

## පදවි ලබති


**මහනුවර** ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරාධිපති ශාස්ත්‍රපති යටිනුවර සුමන නාහිමි උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතිකාරක මහා සංඝ සභාව මගින් මධ්‍යම පළාත හා තදනුබද්ධ ප්‍රදේශයන්හි විතීය සංඝනායක පදවියටත්, පේරාදෙණිය ශ්‍රී සුබෝධාරාම භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රධාන උයන්වත්ත දේවානන්ද විහාරාධිපති ශාස්ත්‍රපති මඩදෙණියේ පුඤ්ඤරතන හිමි ශාසන ජෝතිකාකාරක මහා සංඝ සභාවේ කාරක සභික පදවියට පත්කර ඇත.

## වේඩරුවේ උපාලි අනුනාහිමිට සෙත් පතයි

**මහනුවර** අස්ගිරිය මහා විහාරයීය අභිනව අනුනායක ඓතිහාසික ගෙඩිගේ රාජමහ විහාරාධිකාරී, පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති ශාස්ත්‍රපති වේඩරුවේ උපාලි නාහිමිපාණන්ට දිසාසිරි ප්‍රාර්ථනා කිරීමේ බෝධි පූජාවක් ඇතුළු ආගමික වැඩසටහන් මාලාවක් ශාස්ත්‍රපති කෝමාරිකේ රාහුල හිමිගේ ප්‍රධානත්වයෙන් හා කඳුරට බෞද්ධ කාන්තා සමිතියේ මූලිකත්වයෙන් ගෙඩිගේ රජමහ විහාරයේදී පසුගියදා පැවැත්විණ.

## අත්තරගම නාගිත හිමි හාරිස්පත්තුව ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලබති

**උඩරට** අමරපුර නිකායේ ජෝතිකාකාරක මහා සංඝ සභාව විසින් හාරිස්පත්තුව උප ප්‍රධාන සංඝනායක පදවිය පූජාපිටිය මඩදෙණිය සිරි නිකේතනාරාමාධිපති අත්තරගම නාගිත නාහිමිපාණන් වෙත සිරිධම්මරතන වංශාලංකාර පඤ්ඤජෝති වංශාවතංශ පටිපත්ති ශාසන ශෝභන යන ගෞරව නාම සම්මුතිය සහිත පිරිනමා ඇත.



මඩදෙණිය සිරි නිකේතනාරාමයට අවශ්‍ය වූ අංග සම්පූර්ණ ධර්ම ශාලා මන්දිරයක් ඉදිකර නොබෝද සම්බුද්ධ ශාසනයට කැප කළ අත්තරගම නාගිත නාහිමියෝ හාරිස්පත්තුව ප්‍රදේශයේ ධර්ම විශාරද විචිත්‍ර ධර්ම කථික, ධර්මදර, විනයධර සුපේශල මහ තෙරනමකි.

කේ. බණ්ඩාරනායක


## නොවැම්බර් 22 දාට යෙදෙන මහෝපාධ්‍ය අග්ගමහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද නාහිමිගේ සියවන ජන්මෝත්සවයට ආගමික වැඩසටහන් මාලාවක්

**මහනුවර** මල්වතු මහා විහාරයේ මහෝපාධ්‍ය අග්ගමහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද නාහිමිපාණන්ගේ නොවැම්බර් මස 22 වැනිදට යෙදී තිබෙන සියවැනි ජන්මෝත්සවය නිමිත්තෙන් නාහිමිපාණන්ට දිසාසිරි ප්‍රාර්ථනා කරමින් ආගමික කටයුතු මුල්කරගෙන සමාජ සත්කාර වැඩ සටහන් මාලාවක් මාසයක් තිස්සේ මල්වතු මහා විහාරීය සංඝරාජ ගුණානුස්මරණ සමිතිය, සංඝරාජ දහම් පාසල, සංඝරාජ කාන්තා සමිතිය ප්‍රධාන මහනුවර බෞද්ධ සමිති ඒකාබද්ධව පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

දිසාසිරි ප්‍රාර්ථනා කරන මෙම වැඩ සටහන ඔක්තෝබර් 10 වෙනි දින මල්වතු අස්ගිරි අතිගෞරවාර්හ මහානායක, අනුනායක හිමිවරු ප්‍රධාන ත්‍රෛයිනිකායික මහනායක හිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නය සියක් නමක් විෂයෙහි පිරිනමනු ලබන මහා දානමය පුණ්‍ය කර්මයකින් ආරම්භ කෙරේ. මල්වතු මහා විහාරයීය සංඝරාජ ධර්ම මන්දිරයේදී පවත්වන මෙම වැඩ සටහනට දිවයිනේ සියලුම නිකායන්හි මහානායක හිමිවරුන් වැඩම වන බව සඳහන් වේ.

මෙම වැඩ සටහනට සමගාමීව නොවැම්බර් 22 වෙනිද දක්වා ධම්මානන්ද නාහිමිපාණන්ට ආසිරි ප්‍රාර්ථනා කරන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක්ද, ලේ දන්දීමක්, ප්‍රසාද පූජා, ගවයෙකුට අභය දානය දීමක්, සංඝරාජ පිරිවෙනේ ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව ප්‍රදානයක්ද සිදුකෙරේ.


"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."






# අනුරපුරයෙන් මහානුභාව සම්පන්න බුද්ධ මන්ත්‍රයක් හමුවෙයි

## ක්‍රි.ව. හත්වන සියවසේ සිංහලෙන් ලියූ ධාරණියක්



දැනට පුරාවිද්‍යා ගවේෂණ සහ කැණීම් සිදුකරන අනුරාධපුර විජයාරාම පුරාවිද්‍යා පරිශ්‍රයේ තිබී මහානුභාව සම්පන්න යැයි සැලකෙන මහායාන බුද්ධ මන්ත්‍රයක් හෙවත් ''ධාරණියක්'' සහිත තඹ පතක් හමුවී ඇත. සිංහල බසින් ලියවුණු මෙම ධාරණියේ අක්ෂරවලට අනුව එය ක්‍රි.ව. 600 ගණන්වලට අයත් යයි එම පුරාවිද්‍යා කැණීම් භාරව කටයුතු කරන මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ (අනුරාධපුර) සේවා සම්මානිත මහාචාර්ය ටී. ජී. කුලතුංග මහතා පවසා සිටියි.

''ධාරණී'' යන්න ඉංග්‍රීසි බසින් හඳුන්වනු ලබන්නේ Great Compassionate Mantra නමිනි. එහි සිංහල අරුත ''මහා කරුණා මන්ත්‍ර'' යනුවෙන් සිංහලයට නැංවිය හැක. මෙම මන්ත්‍රවලට වැඳුම් පිදුම් කිරීමත්, ඒවා සජ්ජායනය කිරීමත් මෙලොවදීම මහානුභාව සම්පන්න ප්‍රතිඵල ලැබීමට හේතුවන බව පැවැසේ. මෙම ධාරණිය සහිත තඹ පත නූතන සමාජය පළඳින සුරවල තැන්පත් කරන ආනුභාව යන්ත්‍රයකට තරමක් සමානය.

''ධාරණී'' යන්නෙහි වාචික අර්ථය පමණක් සලකා බැලූ විට අරුත වන්නේ ධාරණය කරගැනීමට හෙවත් වටහා ගැනීම යන්නය. ධාරණී යනු සංස්කෘත බසෙන් රචිත එක්තරා ආකාරයක ගුප්ත මන්ත්‍ර විශේෂයකි. මෙය මතුරන්නාගේ හදවතේ බුද්ධ දේශනාවන් තැන්පත් කරවන්නට තරම් බලයක් ඇතැයි පැවසේ. මනා සිහිය, බලය සහ ප්‍රඥව ළඟාකර ගැනීමේ අරමුණින් මේවා මතුරනු ලබයි. එමෙන්ම මේවා මැතිරීමෙන් දීර්ඝායුෂ, ජයග්‍රහණය, සර්පයන් වැනි විෂඝෝර සතුන්ගෙන් ආරක්ෂාව සහ රෝගාදී කරදරද දුරුවන බැව් විශ්වාස කෙරේ. දැනට ථේරවාදී බුදුදහම අදහන ශ්‍රී ලංකාවේ මෙම ධාරණීවලට තැනක් ලැබී නැතත් අතීතයේ අප රටේ පැවැති මෙම බුද්ධ මන්ත්‍ර චීනය ඇතුළු මහායාන බුදුදහම අදහන බොහෝ රටවල අතිශය ජනප්‍රිය වී තිබේ. ඔවුන් පවසනුයේ මෙම බුද්ධ මන්ත්‍ර සජ්ජායනය කිරීමෙන් තම ජීවිතවලට සියලු දුක් කරදර වැනසී සතුට, සාමය සහ සෞභාග්‍යය තමන් වෙත උදාවන බවය.

ධාරණී පහක් ඇතුළත් ''පංචාරක්ෂා'' යන්න නේපාලයේ ඉතා ජනප්‍රිය පැරණි කෘතියකි. මෙහි පහත සඳහන් ආරක්ෂණ මන්ත්‍ර පහ ඇතුළත් වේ.

මහා ප්‍රාතිසාර - පව්න්, රෝගාදියෙන් සහ නපුරෙන් ආරක්ෂා වීම.
මහා සහස්‍රප්‍රමාදිනී - නපුරු ආත්මයන්ගෙන් ආරක්ෂා වීම.
මහා මයුරි හෝ විද්‍යාරජ්නි - සර්ප විෂෙන් ආරක්ෂා වීම.
මහා සීතාවති - ග්‍රහ අපල, දරුණු සතුන් සහ විෂ සහිත කෘමි සතුන්ගෙන් ආරක්ෂා වීම.
මහා රක්ෂා මන්ත්‍රානුසාරණී - රෝගාදියෙන් ආරක්ෂා වීම.

මෙම පුරාණ ධාරණී මන්ත්‍රය සහිත තඹ පත හමුවූ විජයාරාම පුරාවිද්‍යා නටබුන් සංකීර්ණය යනු ක්‍රි.ව. 7 වැනි සියවසට පමණ අයත් පබ්බත විහාරයක් ලෙස සැලකේ. මෙහි පොහොය ගෙය, පිළිම ගෙය, බෝධි ඝරය, ස්තූපය, ජන්තාඝරය සහ දාන ශාලාවක් ඇතුළත් පුරාණ ස්මාරක 43 ක් හමුවී තිබේ. ඒවා අතර ශංඛ පද්ම බහිරව රූපද තිබේ. අක්කර 23 ක විශාලත්වයකින් යුත් මෙම පබ්බත විහාරය වටා තිබූ දිය අගලක නටබුන් සොයාගැනීමටද මහාචාර්ය ටී. ජී. කුලතුංග ප්‍රමුඛ පර්යේෂක කණ්ඩායමට හැකිවී තිබේ.


අනුරාධපුර විජයාරාමය 1884 දී පමණ එවකට නුවර කලාවියේ ඒජන්ත වූ අයිවර්ස් මහතා හා එස්. එම්. බරෝස් මහතා විසින් සොයා ගැනීමෙන් පසු 1891 දී ශ්‍රී ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. ජී. බෙල් මහතා විසින් මූලික ගවේෂණයක් අරඹන ලදී. එහි ස්තූපය ඒ වනවිටත් නිදන් හොරුන් විසින් හාරා තිබූ බවත් එය සැරූ පස් අතර තිබී මහායාන සූත්‍ර පාඨ සඳහන් තඹ පත්ඉරු හමුවූ බවත් • එතුමන් වාර්තා කර ඇත. එහෙත් ඒ පත්ඉරු මේ වනතුරු සොයා ගත නොහැකිව තිබේ.

එහෙත් විජයාරාම ස්තූපය හා අනිකුත් නටබුන් සංරක්ෂණය සඳහා දැනට කෙරෙන කැණීම්වලදී ස්තූප අංගනයට පහළින් ගොඩ ගසා තිබූ ගොඩැලි නිදන් හොරුන් විසින් ස්තූපය කැටීමේදී ඉවත දැමූ පස්වලින් අනාවරණය විය. එහෙයින් එම පස් ගොඩැල්ල සියුම්ව කළ කැණීම්වලදී ස්තූපයේ නිදන් කර තිබූ තඹ පත්ඉරුවක ලියූ මහායාන ධාරණීය හමුවී ඇත. 1891 වසරේ එස්. සී. ජී. බෙල් මහතා සිදු කළ ගවේෂණයෙන් වසර 124 කට පසුව මෙම පරිශ්‍රය පුරාවිද්‍යා ගවේෂණයකට ලක්වන ප්‍රථම අවස්ථාවද මෙය වේ.

මහායානිකයින් විසින් ස්තූපවල මෙම ධාරණී නිදන් කිරීමේදී ඒවා ධර්ම ධාතු ලෙස සලකා ඇති බව මේ සම්ප්‍රදයටම අයත් අනුරාධපුර පුලියන්කුලම විහාර භූමියෙන් හමු වූ ශිලා ලිපියක ''දහම් ද'' යනුවෙන් සඳහන් වීමෙන් පැහැදිලි වේ. හමුවූ තඹ තහඩුවේ ඇති ධාරණීය හෙවත් බුද්ධ මන්ත්‍රයේ සඳහන් වන්නේ ''ඕම් තරෙතුතරෙතුරෙස්වාහඃ'' යන්නය.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතියෙන්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ මැදිහත්වීමෙන් මෙම වසරේ මුල සිට මෙම පරිශ්‍රයේ කැණීම් ආරම්භ විය. මෙම කටයුත්ත සඳහා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයද විශේෂ අනුග්‍රහයක් දක්වා ඇත. අනාගතයේදී අනුරාධපුර වන්දනාවේ පැමිණෙන බැතිමතුන්ට පුරාවිද්‍යා නටබුන් නැරඹීම සඳහා මෙන්ම විවේක ගැනීම සඳහා මෙම ස්ථානය ''පුරාවිද්‍යා හරිත උද්‍යානයක්'' වශයෙන් සංරක්ෂණය කිරීම සඳහා කටයුතු යොද තිබේ. නමුත් ඉතාම අවාසනාවන්ත තත්ත්වය වන්නේ නොවිධිමත් පස් කැපීමක් නිසා මෙහි ප්‍රවේශ මාර්ගය අවහිර වී තිබීමය. ඒ නිසා වාහනවලින් පැමිණෙන දෙස් විදෙස් සංචාරකයෝ මෙය නැරඹීමට නොහැකිව ආපසු හැරී යති. උතරු මැද පළාත් සභාව මැදිහත් වී මීටර් 500 ක පමණ දුර ප්‍රමාණයක් ඇති මෙම ප්‍රවේශ මාර්ගයේ ගැටලුව නොපමාව විසඳා දෙන්නේ නම් මෙම ස්ථානයේ අගය මහජනතාව අතරේ ප්‍රචලිත වීමට පහසු ඉඩකඩක් සැලසෙනු ඇත.

**නිරංජන් චාමින්ද කරුණාතිලක**




# ඔබ ආරක්ෂා කරන **රත්නමාලි ගාථා යන්ත්‍රය** ගැන මේ කරුණු දැන සිටියාද?

## රත්නමාලී යන්ත්‍රය සහ ගාථා රත්නය

| | |
|---|---|
| සං සාර සාරෝස විනීත ණී | සං |
| සං ණීත සාතං සුවිසාර ධී | සං |
| සං ධීරකං සොණ්ණ තනූ පලා | සං |
| සං ලාප දෙසිං පණමෙහි සා | සං |
| සං සාභිගං කෙවල මෝහ නා | සං |
| සං නාහකං මාර රණේ විසේ | සං |
| සං සේවිතං දාසි මුදාර හා | සං |
| සං හාර ධම්මං පණමේ සදා | සං |
| සං දාසගං නාසිත පාප නා | සං |
| සං නාප ධංසිං හත සෝර පා | සං |
| සං පාර ගාමිං සුවිසාර වා | සං |
| සං වාර සංසං පණමේ රසා | සං |

මහානුභාව සම්පන්න රත්නමාලි තෙරුවන් ආරක්ෂාව



| | |
|---|---|
| සසර සැඩ පහර නවතා නිවන් | වැද |
| පැහිර නැණැති දිරි මත් රන් පහක් | ලෙද |
| නිහර දිළෙන අමි සදහම් දෙසන | ළද |
| වැහිර වදිම් මගෙ සම්බුදු මහිම් | සද |
| සැක තැන් දුරු කරන එලෙසින් මෝ | නසන |
| යුදැදූම් ලෙසින් මර යුගයෙහි දිවි | රකින |
| ඇසුරින් සතුට දෙන කෙලෙසුන් ඇති | නසන |
| නමදිම් බැතින් සිරි සදහම් මිණි | පහන |
| සහ සැප දෙන නැසිය යුතු පව් හැම | නසන |
| බව බැම් සුණු විසුණු කර නිති අණ | පුරන |
| ලත් සැප දමා පර තෙර වෙත නෙත | යොමන |
| වදිනෙම් නිතිපතා පින්සරු මහ | සඟන |

"සියළු පාපයන්ගෙන් අත්මිදෙන්න, නිතර කුසල් දහම්හි යෙදෙන්න, තම සිත පවිත්‍ර කරගන්න, මෙය සියලු බුදුවරුන්ගෙ අනුශාසනාවයි"

දුලන්ජලී හේමචන්ද මහත්මියට පින් පිණිස

අද බොහෝ දෙනා අතර ප්‍රචලිත ගාථා යන්ත්‍රයක් ලෙස සැලකෙන්නේ රත්නමාලී ගාථා යන්ත්‍රයයි. එහි ඉතිහාසය පිළිබඳ විමර්ශනය කරන විට දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි. බුදුරජාණන් වහන්සේ විසින් ගිහි පැවිදි දෙපාර්ශවයට තම ජීවිතය සකසා ගැනීමට නැතිනම් ගොඩනගා ගැනීමට ලබාදුන් ඔවදන් හා උපදෙස් නිරන්තරයෙන් පිළිපදිමින් කටයුතු කළ බෞද්ධ ජනතාව බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමත් සමග ඉන්දියානු සමාජය හා ගොඩ නැගුණු මන්ත්‍ර යන්ත්‍ර බලි යාග තොවිල් පිළිබඳව විශ්වාසය තබමින් එම ආගමික පුද සත්කාර වෙත නැඹුරු වීමට යොමු විය. විශේෂයෙන් බුදුරදුන්ගේ පිරිණිවන් පෑමත් සමග ධර්මාශෝක අධිරාජයා විසින් ඒ සුවාසූ දහසක් ශ්‍රී සද්ධර්මය ව්‍යාප්ත කිරිම සඳහා අසූහාර දහසක් වෙහෙර විහාර ඉදිකරමින් හා ටැන් ලිපි සෙල්ලිපි ආදියෙහි සඳහන් කරමින් ඒ නිර්මල බුදු දහම ව්‍යාප්ත කිරීමට කටයුතු කළහ. ඉන් අවුරුදු 400 කට පසු බිහිවූ තවත් ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයෙක් වූ කණිෂ්ක අධිරාජයා තම ධර්ම ප්‍රචාරය සඳහා බුදු දහම යන්ත්‍ර මන්ත්‍ර මගින් සෙල්ලිපි හා ටැන් ලිපිවල සඳහන් කරමින් ව්‍යාප්ත කිරීමට කටයුතු කළ අධිරාජ්‍යයෙකි. එසේ ව්‍යාප්ත වූ මෙම රත්නමාලී යන්ත්‍ර රාජයා ශ්‍රී ලංකාවේ රජ කළ ශ්‍රේෂ්ඨ රජෙකු වූ වලගම්බා රාජ්‍ය සමයේ බෞද්ධ යන්ත්‍ර භාවිතය ලංකාවේ බෙහෙවින් ප්‍රචලිත වූ බව ජනප්‍රවාදයේ පවතී.

ඉන් ඉක්බිතිව රාජ්‍ය පාලනය කළ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ ලංකාවට පැමිණි බෞද්ධ යන්ත්‍ර දුටුගැමුණු මහ රජතුමා විසින් මහා ඉහළින් පිළිගෙන එය තවදුරටත් ආරක්ෂාව හා ව්‍යාප්තිය පිණිස රන් තහඩුවක ලියා එය ලංකාවේ අසදෘෂ මහා සෑය ලෙස සැලකෙන රුවන්වැලි මහා සෑ රඳුන්ගේ ධාතු ගර්භයේ නිධන්ගත කළ බවද ජනප්‍රවාදයේ එයි. මෙතරම් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන රත්නමාලී රාජයා ලංකාවේ බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඩ වෙසෙන ස්ථානයේ රන් තහඩුවක ලියා තැන්පත් කර ඇති බවද, තවද ශ්‍රී දළදා මාලිගාවේ විවිධ ස්ථානයන්හිද මෙම රත්නමාලි ගාථා රත්නය නිරූපණය වී ඇති බවද තහවුරු වෙයි.

රත්නමාලි ගාථා ආරම්භ වන්නේම ''සං'' ශබ්දයෙන් වන අතර එම ගාථා අවසාන වන්නේද ''සං'' ශබ්දයෙනි. සැබැවින්ම ''ස'' අක්ෂරය යනු ලොව තිබෙන අක්ෂර අතරින් උසස්ම අක්ෂරයයි. මේ ආකාරයට විශේෂිත වැදගත් කමක් ඇති සිද්ධස්ථානයන්හි නිරූපණය වන මහානුභාව සම්පන්න රත්නමාලි ගාථා රත්නයේ තේරුම එක් එක් විද්වතුන් විවිධ ආකාරයෙන් විග්‍රහ කරන විට අප ඒ පිළිබඳව මෙවන් ආකාරයේ අදහස් විග්‍රහයක් සිදුකරයි.

මේ ජීවිත පැවැත්ම තුළ සාරයයි කියා උපාදානය කරගන්නා රාග, ද්වේෂ, මෝහ, ගති නිසා සියලු ආකාර වූ කායික මානසික රෝග දුක් පීඩා තමන්ම නිර්මාණය කර ගන්නේ ''සං'' නොදැකීම ''සං'' තේරුම නොගැනීම නිසාමය. ''සං'' තේරුම ගෙන ''සං'' දැක ''සං'' වලින් වෙන්වීමට ක්‍රියා කිරීමෙන් යහපත් පිරිසිදු සිතක් එනම් (සුවිසාර) මෙන්ම සං පිළිබඳ අවබෝධයක් එනම් (ධී සං) ලැබීමෙන් චතු ආර්ය සත්‍යයන් පණ පිහිටුවා පැවැත්මෙහි ඇති අසාර බව දැක ''සං'' බිහිකරන ආකාරය පිළිබඳ උසස් දැනුමක් හෙවත් (හී සාසං) ලබයි. මෙය බුද්ධ බවමයි.

''සං'' පිළිබඳ නිවැරදි හා උසස් දැනුමක් ලබාගත් පසුව රාගය, ද්වේෂය, මෝහය යනුවෙන් පෙන්වූ ''සං'' නැති කරණ (නා සං) මාර්ගය (කේවල) නිවැරදි අවබෝධය කරගත් පසුව මෙතෙක් මෝහය නිසා මාරයට ණය වීමට (කං මාර) කරණ කියන හිතන ක්‍රියාකාරකම් විශේෂයෙන්ම දැන හඳුනාගෙන (සං දැක) මෙතෙක් මාරයාට තණ්හාවෙන් මාරයාට දාසයකු ලෙසින් ක්‍රියා කළ පැවැත්ම වෙනස් කරගෙන (සං සාර ධම්මං) හේතුඵල ධර්මයට බහා ගලපා බලා චතුරාර්ය සත්‍යයන් පණ පිහිටුවා ඒ අනුව ධම්මානු ධම්ම පටිපදාවෙන්ම ක්‍රියා කරන්නට වෙයි.

මෙතෙක් කාලයක් එකතු කරගත් ''සං'' වටිනවා යැයි ඒ සාරවත් දේවලට දාසයකු ලෙසින් ඇලුණු (සං දාස ගං) ක්‍රියා කලාපයෙන් වෙන් වී පාපයෙන් මිදී අකුසලයෙන් මිදී මෙතෙක් කාලයක් සාර යයි කියා තීරණය කළ සියලු දේ දුක් උපදවන සෝර භයං කර සංසාරයම සකස් කර නිර්මාණය කරන්නටම හේතුවන බව දැක ''සං'' ප්‍රහාණය කර ''සං'' පහදා ඉවත් කර සිත පාරිශුද්ධ තත්ත්වයට පත්කරගෙන වාසය කිරීම (සං සං) විමුක්ති සුවය සම්මා විමුක්තිය සාක්ෂාත් කරගැනීමයි. මඟඵල ලබා විමුක්තියට පත් වීමයි.

මුළු නිවන් මාර්ගයම අනුපූරක නිවන් මාර්ගයක් ලෙසින් අනුපිළිවෙළට ''සං'' දේශනාවක් ලෙසින් මෙහිදී දිග හැර පෙන්වා දී ඇත.

**සංජීව පෙරේරා**